

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ දෙවන සමීක්ෂණය

## මුලතිවු දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව
## 2018 ඔක්තෝම්බර්

බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා,
කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්

cepa
centre for poverty analysis

## විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ දෙවන සමීක්ෂණය

## මුලතිවු දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව

2018 ඔක්තෝම්බර්

**බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා, කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්**

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2018

පළමු වන මුද්‍රණය - 2018

ISBN978-955-3628-37-4

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය පිළිබඳ සමීක්ෂණය : විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (e-CRC) සොයා ගැනීම් : මුලතිවු දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව /

බාසිත් අයිනදීන් ...[සහ තවත් අය]. –
කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2018
පි. 43 ; සෙමී. 29

ISBN 978-955-3628-37-4

i. 352.1607205493 ඩිවි 23 ii බාසිත් අයිනදීන් (සම කර්තෘ)

1. පලාත් පාලනය – ශ්‍රී ලංකාව - පර්යේෂණ

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතුය. මෙම පොතේ යම් කොටසක් ප්‍රති නිෂ්පාදනය කරන්නේ නම් ඊට පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකයාගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ආයතනයේ වර්තමාන ප්‍රකාශන මාලාව සමන්විත වන්නේ මෙම ලියවිලි වලිනි: අධ්‍යයන, සංස්කරණය කරන ලද වෙළුම්, කාර්ය පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා. මෙම අධ්‍යයනයේ ඇතුළත් සොයා ගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කරන ලද්දේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රාජ්‍ය සේවා සම්පාදකයන් හා සේවාලාභීන් විසිනි. මෙම අධ්‍යයනය CEPA ආයතනයේ හෝ ආධාර දෙන ආයතනයේ අදහස් හෝ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම් පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතුය:

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 (011) 46902200, 2676955
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

මෙම ප්‍රකාශනය සම්පාදනය කරන ලද්දේ යුරෝපා සංගමයේ සහාය ඇතිව ය. මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය සම්බන්ධ වගකීම සම්පූර්ණයෙන් ම CEPA ආයතනය විසින් දරනු ලබන අතර යුරෝපා සංගමයේ ස්ථාවරය පිළිබිඹු කරන්නක් ලෙස කිසි සේත් ම සැලකිය නොහැකි ය.

# කතුවරු

## බාසිත් අයිනදීන්

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේ ය. බාසිත් බහුපාර්ශ්වීය ක්‍රියාවලි හා සමාජ ඉගෙනුම් සම්බන්ධයෙන් නෙදර්ලන්තයේ වාහනින්ගන් විශ්වවිද්‍යාලයේ ද සමාජ වග වීමේ මෙවලම්, විශේෂයෙන් ම පුරවැසි වාර්තාපත් ක්‍රමවේදය සම්බන්ධයෙන් ඉන්දියාවේ බැංගලෝරයේ මහජන කටයුතු මධ්‍යස්ථානයේ ද ජාත්‍යන්තර බලපත්‍ර ලාභියෙකි. ක්‍රියාකාරකම් හා ව්‍යවහාරික පර්යේෂණ පිළිබඳ සිය විශේෂඥතාව දායක කරමින් CEPA ආයතනයේ දී බාසිත් නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින ඔහු සමාජ වග වීමේ යන්ත්‍රණයන් පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද ඔහු මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. මේ වන විට ඔහු CEPA ආයතනයේ පුරවැසි වාර්තා පත් යහපාලන මෙවලම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරමින් සිටී.

## ඉසුරු තෙන්නකෝන්

CEPA ආයතනයේ කනිෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකු ලෙස කටයුතු කරයි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව, ආර්ථික ප්‍රතිපත්තිය හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති ඔහු මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයෙහි ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලොමා පාඨමාලාවක් හදාරමින් සිටී. උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු ද වන ඔහු, උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. කවියෙකු වන ඉසුරු මේ වන විට කවි පොත් තුනක් පළ කර ඇත. මීට පෙර ඔහු ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයෙකු හා පර්යේෂණ සහායකයෙකු ලෙස ලාභ නොලබන සංවිධාන සමග කටයුතු කර ඇත. CEPA ආයතනයේ දී ඉසුරු කටයුතු කරන්නේ තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයක් වන දරිද්‍රතාවේ පැතිකඩවල් සම්බන්ධයෙන් සහ සන්නිවේදන කණ්ඩායම සමග ය. මේ වන විට ඔහු පුරවැසි වාර්තාපත පිළිබඳව අවධානය යොමු කරන අධ්‍යයනයක නිරතව සිටින අතර මොණරාගල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කාර්යය භාරව කටයුතු කරයි.

## මේහලා මහිල්රාජා

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන භාවිතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ (SLEvA) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයෙහි (NILS) නිරීක්ෂණය හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර ඇත. CEPA ආයතනයේ දී මේහලා නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. ඇය ක්‍රියාකාරකම් පර්යේෂණ සම්බන්ධයෙන් තමන් සතු විශේෂඥතාව පර්යේෂණ කටයුතුවලට එක් කරයි. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින මේහලා සමාජ වග වීමේ යන්ත්‍රණයන්, විශේෂයෙන් ම 'පුරවැසි වාර්තා පත්' මෙවලම, පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. ඇය වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද දායක වී ඇත.

## කුලසබානාදන් රොමේෂන්

CEPA ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙක් ද කළමණාකරන කණ්ඩායමේ සාමාජිකයෙක් ද වේ. පසු ගිය විසි වසර තුළ ඔහු රජය හා අරමුදල් සපයන සංවිධාන සමග එක්ව සංවර්ධන ක්ෂේත්‍රයෙහි කටයුතු කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

දරිද්‍රතාවේ පැතිකඩවල් වැඩසටහනේ කණ්ඩායම් නායකයෙකු වන රොමේෂ් සහ ඔහුගේ කණ්ඩායම CEPA ආයතනයේ පර්යේෂණ හා උපදේශන ක්‍රියාකාරකම් පදනම් කර ගෙන දරිද්‍රතාව, අසමානතාව හා සමෘද්ධිය පිළිබඳ පණිවුඩ සසඳා බැලීම සම්බන්ධයෙන් වගකීම දරති. දරිද්‍රතාවේ පැතිකඩවල් කණ්ඩායම දරිද්‍රතාමානය පිළිබඳ කටයුතුවල ද නිරතව සිටින අතර දරිද්‍රතාවට සාර්ව සාධක කරන බලපෑම විමසා බැලීම සඳහා ද මුල පුරමින් සිටියි.

## හසන්ති තෙන්නකෝන්

ටැස්මේනියා විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර සමායතනික ස්ථාවර භාවය සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබා ඇත. ඇයගේ අවධානය යොමු වන්නේ පාරිසරික තිරසර භාවය හා සමාජීය තිරසර භාවය යන ක්ෂේත්‍ර කෙරෙහි ය. මේ වන විට ඇය CEPA ආයතනයේ පර්යේෂණ උපදේශකවරයෙකු ලෙස මෙන් ම ලෝක බැංකුවේ සමාජ ආරක්ෂණ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කරයි.

## දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් කිරීමට කටයුතු කරන ස්වාධීන, ශ්‍රී ලාංකික බුද්ධිමතුන් කණ්ඩායමක එකතුවකි. දරිද්‍රතාව යනු වහා විසඳුම් සෙවිය යුතු සමාජ,ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අසාධාරණයන් සිදුවන්නක් බව අපගේ අවබෝධයයි. දරිද්‍රතාව සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීමට නම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනස් විය යුතු බව හා දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා සමග එක්ව වැඩ කළ යුතු බවට CEPA ආයතනය විශ්වාස කරයි. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් හා ව්‍යාපෘති වල දී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා දායක වීමට CEPA ආයතනය ප්‍රමුඛත්වය ලබා දේ. CEPA ආයතනය ලෙස අප අවධානය යොමු කරන්නේ ස්වාධීන විශ්ලේෂණ ඉදිරිපත් කිරීම, සංවර්ධන ක්‍රියාවලියට දායක වන්නන්ගේ හැකියාවන් වර්ධනය සහ ප්‍රතිපත්තිමය බලපෑම් කළ හැකි අවස්ථා සොයා බලා ඊට මැදිහත් වීම කෙරෙහිය. වඩා විශ්වසනීය අනුභූතික සාක්ෂි පදනම් කර ගෙන සමාජීය අවශ්‍යතාවයන් හඳුනාගෙන සේවාවන් සැපයීමට අප ආයතනය කටයුතු කරනු ලබයි. CEPA ආයතනය සේවාදායකයන්ගේ ඉල්ලීම් අනුව සුදුසු බුද්ධිමය හා තාක්ෂණික සේවාවන් ලබා දීම මෙන්ම පශ්චාත් ගැටුම් සංවර්ධනය, අවදානමට ලක් වීමට තිබෙන ඉඩකඩ, සංක්‍රමණය, යටිතල පහසුකම් හා පරිසරය වැනි පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර පහක් පදනම් කර ගෙන කාලීන වැදගත්කමකින් යුත් පර්යේෂණවල ද නිරත වේ.

# ස්තුතිය

මෙම අධ්‍යයනයට සහාය දීම සම්බන්ධයෙන් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යුරෝපා සංගමයට සිය ස්තුතිය පුද කර සිටී. අධ්‍යයනය සඳහා මුල පුරන ලද්දේ CEPA ආයතනය ACTED ආයතනයේ හවුල්කාරිත්වය ඇතිව ක්‍රියාත්මක කරන *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* පිළිබඳ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ය. පුරවැසි වාර්තාපත් සමීක්ෂණය සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී CEPA ආයතනය මූලිකත්වය ගත්තේ ය.

මෙම අධ්‍යයනය සිදු කළ හැකි වූයේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන්, සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් (ACLGs), ප්‍රාදේශීය සභා ලේකම්වරුන් සහ මුලතිවු, මඩකලපුව හා මොණරාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් විසින් අපට ලබා දෙන ලද සහාය නිසයි. තවද, මෙම කාර්ය සාර්ථක කර ගැනීමට සිය සහයෝගය දැක්වීම පිළිබඳව CEPA ආයතනය විසින් මුලතිවු දිස්ත්‍රික්කයේ සියලු සිවිල් සංවිධාන වලට ස්තුතිය පිරි නමන අතර මෙම අධ්‍යයනය සාර්ථක කිරීම සඳහා තොරතුරු සම්පාදනය කරමින් දෙමව්පියන් හා සිසුන් ලබා දුන් අගනා දායකත්වය වෙනුවෙන් ද කෘතඥතාව පළ කර සිටී.

මුලතිවු දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සංවිධාන

| අංක | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම | සිවිල් සමාජ සංවිධානයේ නම |
|---|---|---|---|
| 1 | මැරිටයිම්පත්තු | සෙල්වපුරම් | වැඩිහිටි සමිතිය |
| 2 | මැරිටයිම්පත්තු | මුල්ලිවයික්කාල් නැගෙනහිර | වට්ටුවාහල් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 3 | මැරිටයිම්පත්තු | මුල්ලිවයික්කාල් බටහිර | මුල්ලිවයික්කාල් බටහිර කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 4 | මැරිටයිම්පත්තු | කල්ලපාඩු දකුණ | කල්ලපාඩු දකුණ ග්‍රාම සංවර්ධන සමිතිය |
| 5 | මැරිටයිම්පත්තු | මුලතිවු දකුණ | උන්නාපිලවු කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 6 | මැරිටයිම්පත්තු | වට්ටපලෙයි | වට්රාපලෙයි ගොවි සංවිධානය |
| 7 | මැරිටයිම්පත්තු | සිලාවත්තෙයි | සිලාවත්තෙයි කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| 8 | මැරිටයිම්පත්තු | මාමූලෙයි | මාමූලෙයි ග්‍රාම සංවර්ධන සමිතිය |
| 9 | මැරිටයිම්පත්තු | මුල්ලියවලෙයි උතුර | මුල්ලියවලෙයි උතුර ග්‍රාම සංවර්ධන සමිතිය |
| 10 | මැරිටයිම්පත්තු | කේප්පපිලවු | සාන්ත අන්තෝනි ධීවර සමිතිය |
| 11 | ඔට්ටුසුඩාන් | විද්‍යාපුරම් | විද්‍යාපුරම් ග්‍රාම සංවර්ධන සමිතිය |
| 12 | ඔට්ටුසුඩාන් | මාන්කුලම් | මාන්කුලම් උතුර ගොවි සංවිධානය |
| 13 | ඔට්ටුසුඩාන් | මුත්තයියන්කට්ටු කුලම් | ගොවි සංවිධානය |
| 14 | ඔට්ටුසුඩාන් | තිරුමුරුකන්ඩි | තිරුමුරුකන්ඩි ග්‍රාම සංවර්ධන සමිතිය |

| | | | |
|---|---|---|---|
| 15 | ඔට්ටුසුඩාන් | ඊන්දුපුරම් | ඉන්දුපුරම් ග්‍රාම සංවර්ධන සමිතිය |
| 16 | ඔට්ටුසුඩාන් | ඔට්ටුසුඩාන් | චින්නවාලම්පන් ග්‍රාම සංවර්ධන සමිතිය |
| 17 | ඔට්ටුසුඩාන් | කට්සිලෙයිමඩු | කට්සිලෙයිමඩු ගොවි සංවිධානය |
| 18 | වැලිඔය | කනකපුර | සුභසාධක සමිතිය |
| 19 | වැලිඔය | කිරිඉබ්බන් වැව | සමෘද්ධි සමිතිය |
| 20 | වැලිඔය | නිකවැව දකුණ | ගොවි සංවිධානය |

මෙම අධ්‍යයනයේදී දත්ත සමීක්ෂකයන්ට මග පෙන්වමින් ඔවුන් සමග කටුතු කරමින්, අනුෂා සිවලිංගම් හා ෂෙහානා මිර්සා යන ආයතන පර්යේශිකාවන් විසින් දක්වන ලද සහයෝගය වෙනුවෙන් ඔවුනට ද අප ස්තූතිය මෙහිදී හිමි වේ.

# කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| ACLG | සහකාර පළාත් පාලන කොමසාරිස් |
| EU | යුරෝපා සංගමය |
| CEPA | දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| CSO | සිවිල් සමාජ සංවිධානය |
| CRC | පුරවැසි වාර්තාපත |
| eCRC | විද්‍යුත් පුරවැසි වාර්තාපත |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DDE | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ |
| GNDs | ග්‍රාම නිලධාරි වසම් |
| PS | ප්‍රාදේශීය සභාව |
| WRDS | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| RDS | ග්‍රාම සංවර්ධන සමිතිය |

# රූප සටහන් මාලාව


1 වැනි රූප සටහන : ජලය පැවතීම හා භාවිතය ........................................................................ 9
2 වැනි රූප සටහන : මාර්ග හා අතුරු මාර්ග පැවතීම හා භාවිතය ............................................... 10
3 වැනි රූප සටහන : වීදි ලාම්පු පැවතීම ................................................................................ 11
4 වැනි රූප සටහන : කසළ එක්රැස් කිරීමේ සේවාවන් පැවතීම හා භාවිතය ..................................... 11
5 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පැවතීම හා භාවිතය ..................................................... 12
6 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පැවතීම හා භාවිතය .................................................... 13
7 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පැවතීම හා භාවිතය ..................................................... 13
8 වැනි රූප සටහන : ජල සම්පාදන සේවාවන් පිළිබඳ තෘප්තිය ....................................................... 14
9 වැනි රූප සටහන : මාර්ග පිළිබඳ තෘප්තිය ............................................................................ 15
10 වැනි රූප සටහන : වීදි ආලෝකය පිළිබඳ තෘප්තිය .................................................................. 16
11 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පිළිබඳ තෘප්තිය ......................................................... 16
12 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පිළිබඳ තෘප්තිය ........................................................ 17
13 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පිළිබඳ තෘප්තිය ......................................................... 17
14 වැනි රූප සටහන : සේවාවන් ලබා ගන්නා විට දැරීමට සිදු වන සැඟවුණු වියදම් ............................ 18
15 වැනි රූප සටහන : පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දැක්වීම ............................................... 19
16 වැනි රූප සටහන : පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ තෘප්තිය .............................. 20
17 වැනි රූප සටහන : සේවාවන් පිළිබඳ තෘප්තිය ආශ්‍රිත ශ්‍රේණිගත කිරීම් ................................................ 22
18 වැනි රූප සටහන : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසින් වහාම අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා සේවා .. 23
19 වැනි රූප සටහන : මැරිටයිම්පට්ටු කොට්ඨාශය තුළ පවත්නා වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා සේවා .......... 24
20 වැනි රූප සටහන : ඔට්ටුසුඩාන් කොට්ඨාශය තුළ පවත්නා වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා සේවා .............. 24
21 වැනි රූප සටහන : වැලිඔය කොට්ඨාශය තුළ පවත්නා වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා සේවා .................... 25

# අන්තර්ගතය

1. හැඳින්වීම ..... 1

1.1. ව්‍යාපෘතිය ..... 1

1.2. වාර්තාවේ විෂය පථය ..... 1

1.3. අධ්‍යයනයේ අරමුණු ..... 2

1.4. නියැදිකරණය ..... 2

1.5. ක්‍රමවේදය ..... 4

1.5.1. පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද? ..... 4

1.5.2. විද්‍යුත් පුරවැසි වාර්තාපතක් (eCRC) යනු කුමක් ද? ..... 4

1.5.3. විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම ..... 5

1.5.4. විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුතු සේවාවන් හඳුනා ගැනීම ..... 6

1.5.5. කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම ..... 6

1.6. අධ්‍යයන ප්‍රදේශය ..... 7

2. ප්‍රධාන සොයා ගැනීම් ..... 9

2.1. සේවාවන් පැවතීම, ප්‍රවේශය හා භාවිතය ..... 9

2.2. සේවාවන් පිළිබඳ සමස්ත තෘප්තිය ..... 14

2.3. සැඟවුණු වියදම් ..... 18

2.3.1. සේවාවන් ලබා ගැනීම සඳහා දැරූ වියදම් ..... 18

2.3.2. පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දක්වනසුලු බව ..... 19

3. සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය ..... 21

4. නිර්දේශ ..... 23

4.1. වැඩි දියුණු කළ යුතු සේවා අංශ ..... 23

4.1.1. සංවර්ධනයන සඳහා ඉක්මනින් අවධානය යොමු කළ යුතු අංශ ..... 23

4.1.2. වෙනත් සලකා බැලීම් ..... 25

4.2. ඉදිරි මාවත ..... 26

# 1. හැඳින්වීම

## 1.1. ව්‍යාපෘතිය

යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* ව්‍යාපෘතියේ අභිමතාර්ථය වන්නේ වඩාත් හොඳ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම හා රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ආයතන සමග සහයෝගී වීමට සිවිල් සමාජ සංවිධාන (CSOs) සතු හැකියාව ශක්තිමත් කිරීම, වැඩි දියුණු කිරීම සහ ඒ අතර සේවා සම්පාදකයන්ගේ වග වීම සහතික කිරීම යි. ACTED ආයතනය සහ CEPA ආයතනය පහත දැක්වෙන ව්‍යාපෘති ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගීව කටයුතු කරමින් සිටී. 2018 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසයන්හි දී මොණරාගල, මඩකලපුව හා මුලතිවු දිස්ත්‍රික්ක වල මෙම අධ්‍යයනයේ පාදක සමීක්ෂණය සිදු කරනු ලැබූ අතර, මෙම ප්‍රගති සමීක්ෂණය සඳහා වන දෙවන සමීක්ෂණය 2018 වසරේ සැප්තැම්බර් මාසයේදී සිදු කරන ලද්දේ පළාත්පාලන ආයතන වල සිදු වූ ප්‍රගතිය විමසා බැලීමේ අපේක්ෂාවෙනි.

පහත දැක්වෙන ප්‍රතිඵල (R1 සහ R2) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය ACTED ආයතනයට පැවරී ඇත.

- R1 - සිවිල් සමාජ සංවිධානවලට සිය විධි නියෝගයන් ක්‍රියාත්මක කිරීමට තිබෙන හැකියාව සහ ප්‍රාදේශීය සමාජ සංවර්ධන ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව නිරත වීමට තිබෙන හැකියාව වැඩි දියුණු කෙරේ.
- R2 - සහභාගීත්ව බහුපාර්ශ්වීය ප්‍රවේශයක් මගින් සමාජ සේවාවන් ආශ්‍රිත ප්‍රාදේශීය අවශ්‍යතා හා අඩුපාඩුකම් හඳුනා ගැනෙන අතර සිවිල් සමාජ සංවිධාන සහ රජයේ ආයතන විසින් විසඳුම් ලබා දීමට කටයුතු කෙරේ.

පහත දැක්වෙන ප්‍රතිඵලය (R3) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය CEPA ආයතනයට පැවරී ඇත.

- R3 - සේවා සම්පාදකයන් ලවා වඩාත් හොඳින් වග වීම සඳහා සමාජ සේවා සම්පාදනය/ඒවායේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම වැඩි කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කෙරෙන අතර ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම සඳහා යහභාවිතයන් ප්‍රචලිත කෙරේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස CEPA ආයතනය ක්‍රියාකාරකම් ගණනාවකට මුල පිරිය යුතු අතර ඒවා පහත දැක්වේ:

- විවිධ මට්ටම්වල රාජ්‍ය සේවා සම්පාදකයන් හඳුනා ගැනීම,
- ඉලක්ක කෙරෙන සිවිල් සමාජ සංවිධානවලින් සංගණනකරුවන් තෝරා ගැනීම,
- සංගණනකරුවන්ට පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් ලබා දීම,
- ප්‍රශ්නාවලි සකස් කිරීමට හා දත්ත රැස් කිරීමට පහසුකම් සැපයීම,
- ප්‍රතිඵල රජයේ ආයතන වෙත යොමු කිරීම සහ සේවාවන් ආශ්‍රිත අඩුපාඩුකම් සපුරාලීම සඳහා සැලසුම් සකස් කිරීමට ඒවාට සහාය වීම.

## 1.2. වාර්තාවේ විෂය පථය

මෙම වාර්තාව මගින් **මුලතිවු දිස්ත්‍රික්කයේ** තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් ඇසුරෙන් **ප්‍රාදේශීය සභා සේවා සැපයීම** පිළිබඳව සොයා ගැනීම් ඉදිරිපත් කරනු ලැබේ. මෙම සමීක්ෂණය 2018 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසයන් වල දී කරන පළමු සමීක්ෂණය වන අතර, 2018 සැප්තැම්බර් මාසයේ කරන ලද්දේ දෙවැනි සමීක්ෂණය යි. සමීක්ෂණය ඇසුරෙන් ආවරණය කරන ලද්දේ **වැලිඔය, ඔට්ටුසුඩාන්** හා **මුහුදුබඩපත්තු** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ග්‍රාම සේවා වසම් වේ.

## 1.3. අධ්‍යයනයේ අරමුණු

අධ්‍යයනයේ විශේෂිත අරමුණු මෙසේ වේ:

(i) රාජ්‍ය සේවාවන් වෙත පවත්නා ප්‍රවේශය, ඒවායේ ගුණාත්මක බව හා එම සේවාවන් සැබවින් පරිහරණය කරන්නන්ගේ තෘප්තිය තක්සේරු කිරීමේ මෙවලමක් ලෙස සහ සමාජීය වගවීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත යොදා ගැනීම,

(ii) මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ක්‍රියාකාරීව ප්‍රචලිත කිරීම සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ඉටු කර ගැනීම සඳහා ඒවා යොදා ගැනීම,

(iii) වෙනත් දිස්ත්‍රික්කවල වෙනත් රාජ්‍ය ආයතන තුළ මීට සමාන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා සැබෑ පරිහරණය කරන්නන්ගේ මෙම අත්දැකීම ඉදිරිපත් කිරීම.

## 1.4. නියැදිකරණය

සේවාවක් භාවිත කරන ජන ප්‍රතිශතය, සේවාවක් සම්බන්ධයෙන් තෘප්තිමත් ජන ප්‍රතිශතය යනාදි තොරතුරු උකහා ගනිමින් යම් අධ්‍යයන ප්‍රදේශයක සේවා සම්පාදනයේ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රවේශ දෙකක් පවතී. එක් ක්‍රමයක් වන්නේ එම කණ්ඩායමේ සෑම පුද්ගලයෙකුගෙන්ම විමසා අවශ්‍ය තොරතුරු රැස් කර ගෙන අනතුරුව සොයා ගැනීම් සම්පිණ්ඩනය කිරීමයි. මෙම විධික්‍රමය පූර්ණ ගණන් ගැනීම නොහොත් සංගණනය ලෙස හඳුන්වනු ලැබේ. මෙම තොරතුරු උකහා ගත හැකි තවත් ක්‍රමයක් වන්නේ වඩාත් විශාල ජන කණ්ඩායමකින් උපකුලකයක් තෝරා ගෙන එම උපකුලකයෙන් අදාළ තොරතුරු රැස් කර ගැනීමයි. මෙම ක්‍රමය නියැදිකරණය ලෙසත් තෝරා ගත් උපකුලකය නියැදිය ලෙසත් හඳුන්වනු ලැබේ. වඩාත් පිරිවැය ඵලදායක වූ නිසා සහ එතරම් ශ්‍රම සූක්ෂ්මතාවක් අවශ්‍ය නොවූ නිසා මෙම අධ්‍යයනය සඳහා නියැදිකරණ සමීක්ෂණය වඩාත් සුදුසු විය.

දත්තවල විශ්වසනීයත්වය හා නිරවද්‍යතාව නියැදිය තෝරා ගැනෙන ආකාරය මත රඳා පවතී. හොඳම නියැදියක් වන්නේ එය විසින් අධ්‍යයන ප්‍රදේශය තුළ ජීවත් වන සමස්ත ජනගහනයේම විවිධතා හා ලක්ෂණ නියෝජනය කෙරෙන විට ය.

විද්‍යුත් පුරවැසි වාර්තාපත ප්‍රධාන වශයෙන් සේවාවන් දෙවර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරිණ. එකක් ද්විතීය නිදහස් අධ්‍යාපනය ද අනෙක ප්‍රාදේශීය සභා විසින් සැපයෙන සේවා ද විය. විද්‍යුත් පුරවැසි වාර්තාපත ACTED ආයතනය විසින් මුලතිවු, මඩකලපුව හා මොණරාගල දිස්ත්‍රික්කවලින් තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි වසම් 60ක් ආවරණය කළේය. සමීක්ෂණය සඳහා යොදා ගැනුණු නියැදියේ විශාලත්වය තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 60න් කුටුම්බ 1,200ක් නොහොත් ඒ ඒ දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20න් කුටුම්බ 400ක් විය යුතු යැයි තීරණය කෙරිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් 20න් තෝරා ගැනුණු කුටුම්බ 400 අනතුරුව ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සැබෑ සේවාලාභීන් සංඛ්‍යාව අනුව බෙදා වෙන් කරන ලදි.

මඩකලපුව, මුලතිවු හා මොණරාගල යන දිස්ත්‍රික්ක තුනේ දී ම නියැදිකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලද්දේ අදියර ගණනාවකිනි. පළමු අදියරේ දී ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා කුටුම්බ පිළිබඳ දත්ත පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් විසින් පාසල් යන වයසේ (5 සිට 13 ශ්‍රේණිය දක්වා) දරුවන් සිටින කුටුම්බ හඳුනා ගෙන ලැයිස්තුගත කෙරිණ. සමීක්ෂණය සඳහා යොදාගත් කුටුම්බ නියැදිය ඒ ඒ ග්‍රාම නිලධාරි වසමෙන් අපේක්ෂිත නියැදියේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් අහඹු ලෙස තෝරා ගැනිණ. මේ අතර, ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ සමීක්ෂණය සඳහා තෝරා ගත් නියැදිය ද මෙම කුටුම්බ යටත් පිරිසෙයින් ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන එක් රාජ්‍ය සේවාවක්වත් භාවිත කරන්නේය යන නිර්ණායකය පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ ක්‍රියාකාරී සිවිල් සමාජ සංවිධාන විසින් හඳුනා ගැනුණු ඉහත සඳහන් කරන ලද කුටුම්බ අතරින්ම තෝරා ගැනිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ නියැදිකරණ ක්‍රියාවලිය සඳහා මුල පුරන ලද්දේ කුටුම්බ අනුපාතයන් සහ ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා සියලු ගම්මාන නියෝජනය වන පරිදි වඩාත් පුළුල් ආවරණයක් සාක්ෂාත් කර ගත යුතු බව සිත තබා ගනිමිනි. සමස්තයක්


ලෙස ගත් කල විද්‍යුත් පුරවැසි වාර්තාපත සඳහා කුටුම්බ 1,200ක් (මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 400ක්, මොණරාගල දිස්ත්‍රික්කයෙන් 400ක් සහ මුලතිවු දිස්ත්‍රික්කයෙන් 400ක්) සම්බන්ධ කර ගැනිණ. ගුණාත්මකබව පිළිබඳ සියලු පරීක්ෂාවන්ගෙන් පසුව විශ්ලේෂණය සඳහා ඒ අතරින් තෝරා ගැනුණු වලංගු නියැදිය තුළින් දිස්ත්‍රික්ක තුනේ ග්‍රාම නිලධාරි වසම් 60 ආවරණය විය.

නියදියට අදාළව අවශ්‍ය සියලුම කුටුම්බයන් මෙම  දෙවන සමීක්ෂණය යටතේ ආවරණය කරන ලදී. කෙසේ වෙතත් මීට පෙර සමීක්ෂණය කරන ලද නිවසටම ගොස් තොරතුරු ගැනීම අත්‍යවශ්‍ය නොවන අතර පළමු සමික්ෂණයේ දී ඇතැමුන් අධ්‍යයනයට භාජනය නොවී තිබුණද, අධ්‍යනයට බඳුන් කරන ලද ප්‍රදේශයේ පවුල් වලින් ලැබුණු සියලුම ප්‍රතිචාර හා එම සේවාන්ගේ යථා තත්වයන් පිළිබඳ සපයන ලද පිළිතුරු මෙම සියලුම ප්‍රදේශයන් හි සේවා සැපයුමට හා ඒවායේ ගුණාත්මක බවට  අදාළ වේ.

නියැදිකරණයට මුල පුරන ලද්දේ පහත දැක්වෙන නියැදිකරණ ආකෘතිය පදනම් කර ගෙන ය.

| ජනගහනය (කුටුම්බ) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 95%) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 90%) |
|---|---|---|
| 100 | 80 | 66 |
| 500 | 217 | 141 |
| 1,000 | 278 | 164 |
| 5,000 | 357 | 189 |
| 10,000 | 370 | 192 |
| 30,000 | 379 | 195 |
| 50,000 | 381 | 195 |
| 100,000 | 383 | 196 |
| 200,000 | 383 | 196 |

නියැදිකරණ ක්‍රියාවලිය සඳහා පහත දැක්වෙන ඡායාරූපය වැනි චන්ද්‍රිකා ඡායාරූප යොදා ගන්නා ලද අතර, ඒ ඔස්සේ මුලතිවු දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කරන ලද ප්‍රදේශ පහත චන්ද්‍රිකා ඡායාරූපය ඇසුරින් හඳුනාගත හැකිය.



## 1.5. ක්‍රමවේදය

### 1.5.1. පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද?

පුරවැසි වාර්තාපත (CRC) යනු රාජ්‍ය සේවාවන්ගේ කාර්ය සාධනය පිළිබඳව ක්‍රමානුකූල සහ සැබවින් පරිහරණය කරන්නන්ගේ ප්‍රතිචාර ලබා ගත හැකි සරල නමුත් බලගතු මෙවලමකි. එය සැබවින් පරිහරණය කරන්නන්ගෙන් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව හා ප්‍රමාණවත් බව පිළිබඳ ප්‍රතිචාර රැස් කර ගන්නා සහභාගිත්ව සමීක්ෂණයකි. පුරවැසි වාර්තාපත සේවා සම්පාදකයන් සමග සංවාදයක යෙදීමට සහ රාජ්‍ය සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඔවුන් ලවා වග වීමට ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන හෝ පළාත් පාලන ආයතන වෙත විද්‍යානුකූල පදනමක් හා ප්‍රායෝගික ප්‍රවේශයක් සම්පාදනය කරයි. පුරවැසි වාර්තාපත මුලින් ක්‍රියාත්මක කරන ලද්දේ නාගරික පරිසරයන් තුළ වුවත් දැන් එය රාජ්‍ය සේවා සම්පාදනයේ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා භූගෝලීය පසුබිම් සහ දේශීය වාතාවරණයන් ගණනාවක දී ම යොදා ගැනේ.

පුරවැසි වාර්තාපත ප්‍රතිලාභ ගණනාවක් අත් කරදෙයි. තමන් සම්පාදනය කරන රාජ්‍ය සේවාවන් මහජනයා වෙත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අයුරින් ළඟා වන්නේ දැයි සොයා ගැනීමේ පිරිවැය ඵලදායක ක්‍රමවේදයක් මෙමගින් සේවා සම්පාදකයන් වෙත සැපයේ. එමෙන් ම එය තමන්ට ලැබෙන සේවාවන්ගේ ගුණාත්මක බව, කාර්යක්ෂමතාව හා ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් ප්‍රතිචාර සහ සේවා සම්පාදකයන් සමග ගනුදෙනු කරන විට තමන් මුහුණ දෙන ප්‍රශ්න පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන් වෙත පිරිනමයි. විවිධ සේවා සම්පාදකයන් සිටින ප්‍රදේශවල දී විවිධ සේවාවන් සම්බන්ධයෙන් පරිහරණය කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම් සසඳා බැලීමට හැකියාව ලැබේ. මෙලෙස (පරිහරණය කරන්නන්ගේ තෘප්තිය පදනම් කර ගෙන) සිදු වන තක්සේරුව අනතුරුව යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් සේවා සම්පාදකයන්ගේ කාර්ය සාධනය මැන බැලිය හැකි 'වාර්තාපතක්' බවට පත් වේ. පුරවැසි වාර්තාපතෙන් පිළිබිඹු වන්නේ රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන්ගේ සැබෑ අත්දැකීම් නිසා පුරවැසි වාර්තාපත රාජ්‍ය සේවාවන් පිළිබඳව කෙරෙන මත විමසුම් සමග පටලවා නොගත යුතුය. උදාහරණයක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගන්නා සමීක්ෂණවල දී ඉලක්ක කර ගැනෙන්නේ යම් යම් සේවාවන් භාවිත කර ඇති සහ/හෝ අදාළ රාජ්‍ය ආයතන සමග ගනුදෙනු කර ඇති පුද්ගලයන් පමණකි.

රටවල් 20කට වැඩි ගණනක දී ප්‍රාදේශීය හා ජාතික ආණ්ඩු සහ සිවිල් සමාජ සංවිධානවල පටන් සංවර්ධන හවුල්කරුවන් දක්වා වූ විවිධ ආයතන විසින් පුරවැසියන් සම්බන්ධ කර ගැනීමේ හා සේවාවන් වැඩි දියුණු කිරීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගනු ලැබ ඇත. මෙම මෙවලම සාමාන්‍යයෙන් දත්ත උත්පාදනය කරන්නේ පුරවැසියන් සහ ආණ්ඩුව එකිනෙකාට හමු වන තැන දී නිසා බොහෝ බලපෑම් ක්ෂේත්‍රවලදී එය ප්‍රයෝජනයට ගත හැකි ය. උදාහරණයක් ලෙස එයට රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් පෝෂණය කිරීමේ, පාලන ක්‍රියාවලි හා සේවා සම්පාදන යන්ත්‍රණයන් නැවත සකස් කිරීමේ සහ රාජ්‍ය හා ප්‍රජා ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ පදනම බවට පත් විය හැකි ය.

පුරවැසි වාර්තාපතේ එක් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ විවෘත ප්‍රතිචාරයන් නොදක්වන ප්‍රජාවන්ට සිය අදහස් පළ කිරීම සඳහා ඉඩක් සලසා දීමට ඊට තිබෙන හැකියාව යි. මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල පිහිටි ඉතා දුර බැහැර හා ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදු නොවන ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ මෙම සුවිශේෂ අධ්‍යයනයේ දී සිදු වූයේ එය යි. මෙහි අභිමතාර්ථය වූයේ තෝරා ගැනීම් තමන් විසින් ම කරනු ලැබීම සඳහා, තම අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සහ ආත්ම විශ්වාසයෙන් යුතුව තිරසර ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රජාවන් බල ගැන්වීම යි. මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා CEPA ආයතනය ප්‍රජා පාදක පර්යේෂණ ඔස්සේ හඳුනා ගැනුණු ප්‍රමුඛතාව දෙන ලද සේවාවන් තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය. මෙහි අරමුණ වූයේ පුරවැසියන්ට හිතැති සහ අයිතිවාසිකම් පදනම් කර ගත් දැක්මකින් යුතුව දැනට පවත්නා භාවිතයන්ට හා ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම යි.

### 1.5.2. විද්‍යුත් පුරවැසි වාර්තාපතක් (eCRC) යනු කුමක් ද?

විද්‍යුත් පුරවැසි වාර්තාපත (eCRC) යනු නවීනතම තාක්ෂණයේ බලය හා පහසුව ප්‍රයෝජනයට ගනිමින් පුරවැසි වාර්තාපත් ක්‍රියාත්මක කිරීමේ විප්ලවීය ප්‍රවේශයකි. විද්‍යුත් පුරවැසි වාර්තාපත ඇන්ඩ්‍රොයිඩ් මෙහෙයුම් පද්ධතිය

පදනම් කර ගත් ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් මගින් විශ්වසනීය ආකාරයෙන් පුරවැසි ප්‍රතිපෝෂණ රැස් කිරීමටත් රැස් කර ගත් තොරතුරු ඒ මොහොතේ ම විශ්ලේෂණය කිරීමට හා වාර්තා කිරීමටත් හැකියාව ලබා දෙයි. විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය අංග කිහිපයකින් සමන්විත වේ:

**(a) සමීක්ෂණය පැවැත්වීම**

ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් යොදා ගනිමින් ටැබ්ලට් පරිගණකයක් ඔස්සේ මහජන ප්‍රතිපෝෂණ හා අත්දැකීම් පිළිබඳ විද්‍යාත්මක නියැදි සමීක්ෂණයක් පවත්වනු ලැබේ. ජංගම දුරකථන/ටැබ්ලට් පරිගණකවල පවත්නා GPS සෙවුම් පද්ධතිය දත්ත රැස් කර ගත් ස්ථානය පෙන්නුම් කරන නිසා දත්ත රැස් කිරීමේ විශ්වසනීයත්වය වැඩි දියුණු වේ.

**(b) තත්ත්ව පාලනය සඳහා දූරස්ථ නිරීක්ෂණය**

වෙබ් ජාලය පදනම් කර ගත් සමීක්ෂණ කළමනාකරන මොඩියුලය ඒ මොහොතේ ම සමීක්ෂණයේ ප්‍රගතිය සොයා බැලීමට සමීක්ෂණ කළමනාකරුවන්ට හැකියාව ලබා දෙයි. මෙම මොඩියුලය දූරස්ථ නිරීක්ෂණයට සහ සමීක්ෂණ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට හැකියාව ලබා දෙන අතර එම නිසා වැඩි තත්ත්ව පාලනයක් කළ හැකි බව සහතික කරයි.

**(c) දත්ත විශ්ලේෂණය**

විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලියේ කොටසක් ලෙස නිර්මාණය කරන ලද ඔන්ලයින් මෙවලම් පුවරුව (Dash Board) හා දත්ත විශ්ලේෂණ මෙවලම් (Data analysis tool) විවිධ පාර්ශවකරුවන්ගේ (උදා. ප්‍රතිපත්ති සම්පාදකයන්, පරිපාලකයන්, දේශපාලන නියෝජිතයන් හා පුරවැසියන් යනාදි) තොරතුරු අවශ්‍යතා සපුරයි. සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරිපත් කෙරෙන්නේ පහසුවෙන් අවබෝධ කර ගත හැකි ප්‍රස්තාර, වගු හා සිතියම් මගිනි. කාර්ය සාධන මට්ටම් පහසුවෙන් නිගමනය කිරීමට පහසුකම් සැපයීම සඳහා සරල වර්ණ සංකේත යොදා ගනු ලැබේ.

විද්‍යුත් පුරවැසි වාර්තාපත වාර්තාකරණය සඳහා ජංගම ටැබ්ලට් පරිගණක හා නවීනතම තාක්ෂණය යොදා ගන්නා නිසා එහි වාසි කිහිපයක් පවතී:

- එය ඉතා නිවැරදි දත්ත උත්පාදනය කරයි.
- ක්ෂණික ප්‍රතිඵල ලබා දෙයි.
- සමීක්ෂණය පැවැත්වෙන භූගෝලීය ස්ථානයේ සිතියමක් මත දත්ත/ප්‍රතිඵල විදහා දැක්වීමට හැකියාව ලබා දෙයි;
- එක් වරක් පමණක් ආයෝජන පිරිවැය දරා ක්‍රියාකාරකම නැවත නැවතත් කිරීමට ඉඩ සලසා දෙන නිසා එය වඩාත් පිරිවැය ඵලදායක ය.

## 1.5.3. විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම

මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය පිණිස මඩකලපුව, මොණරාගල හා මුලතිවු යන ඒ ඒ දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් 20ක විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය පැවැත්වීමට සැලසුම් කරනු ලැබිණ. සමීක්ෂණය සැලසුම් කරන ලද්දේ අධ්‍යයනය සඳහා හඳුනාගත් ප්‍රදේශවල ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය සහ ද්විතීය අධ්‍යාපන සේවාවන්හි තත්ත්වය ආවරණය කිරීම සඳහා ය. සමීක්ෂණයේ කාල සීමාව සහ අනෙක් කාර්ය සම්පාදන කටයුතු පිළිබඳව අවසන් තීරණයකට එළඹුණේ අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ගෙන් උපදෙස් ලබා ගනිමිනි. සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන (CSO) කණ්ඩායමක් විසිනි. දිස්ත්‍රික්ක තුන තුළ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා CEPA ආයතනයේ පර්යේෂකයන්ගේ සහ ACTED ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ CEPA ආයතනය විසින් සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් කණ්ඩායම සම්පත් පුද්ගල සංචිතයක් ලෙස පුහුණු කරන ලදි.

## 1.5.4. විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුතු සේවාවන් හඳුනා ගැනීම

ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් සමග පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (FGDs) අතරතුර දී ගැටලු සහිත සහ දියුණු කිරීමේ මූලික අවශ්‍යතාව පවතින ක්ෂේත්‍ර ලෙස ඉස්මතු වූයේ (i) ප්‍රාදේශීය සභා සේවා සහ (ii) ද්විතීය අධ්‍යාපන සේවා (5 වසර-13 වසර) සම්පාදනය යි. මෙම ප්‍රමුඛතා, ACTED ග්‍රාම සංවර්ධන සැලසුම්වල (VDPs) විස්තර කර ඇති ප්‍රමුඛතාවන් සමග ද ගැළපේ.

මේවා අතරින් වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනුණේ ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් යොදා ගනිමිනි.

අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් ගත් කල ප්‍රජාව සමග එක්ව මුල පුරන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ ද්විතීය අධ්‍යාපනය ප්‍රමුඛතාවක් ලෙස හඳුනා ගන්නා ලදි.

## 1.5.5. කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම

ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් සමග පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (FGDs) අතරතුර දී ගැටලු සහිත වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස ඉස්මතු වූයේ (i) ප්‍රාදේශීය සභා සේවා සහ (ii) ද්විතීය අධ්‍යාපන සේවා (5 වසර-13 වසර) සම්පාදනය යි. මෙම ප්‍රමුඛතා ACTED ග්‍රාම සංවර්ධන සැලසුම්වල (VDPs) විස්තර කර ඇති ප්‍රමුඛතාවන් සමග ද ගැළපේ.

තීරණාත්මක සේවාවන් වැඩි දියුණු කර ගැනීමට ප්‍රජාව උනන්දුවෙන් සිටි නිසා ප්‍රාදේශීය සභා සමග සම්බන්ධ වී කටයුතු කිරීමට ඔවුහු කැමැත්තක් දැක්වූහ. නව ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය තම ප්‍රදේශයේ දේශපාලන නියෝජිතයන් සමග ගනුදෙනු කිරීම සඳහාත් තමන්ට පවත්නා ගැටලු ඉදිරිපත් කිරීම සඳහාත් පුරවැසියන්ට වැඩි ප්‍රවේශයක් සලසා දෙයි. ප්‍රාදේශීය සභා විසින් විවිධ වර්ගයේ බොහෝ සේවාවන් සම්පාදනය කෙරෙන අතර විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණයට ඇතුළත් කිරීම සඳහා ප්‍රජාව විසින් ඒ අතරින් ප්‍රමුඛතා සේවා පහක් තෝරා ගැනිණ. එම සේවාවන් මෙසේ ය.

- ජල සම්පාදන සේවා
- කාණු පද්ධතිය
- කසළ ඉවත් කිරීම
- ප්‍රවේශ මාර්ග හා අතුරු මාර්ග
- වීථි අලෝක කිරීම
- ක්‍රීඩාංගණ
- පුස්තකාලය

මේවා අතරින් වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනුණේ ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් යොදා ගනිමිනි.

අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් ගත් කල ප්‍රජාව සමග එක්ව මුල පුරන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ ද්විතීය අධ්‍යාපනය ප්‍රමුඛතාවක් ලෙස හඳුනා ගන්නා ලදි.

දිස්ත්‍රික්ක තුනේ ප්‍රජා කණ්ඩායම් හා පළාත් පාලන බලධාරීන් සමග පැවැත්වූ උපදෙස් විමසීම් මාලාවකින් පසුව ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන සේවාවන්ට සම්බන්ධිතව විශේෂිත දර්ශක කට්ටලයක් හඳුනා ගන්නා ලදි. ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන සේවාවන් තක්සේරු කිරීම සඳහා පහත දැක්වෙන කාර්ය සාධන දර්ශක තෝරා ගන්නා ලදි:

| තෝරා ගත් ප්‍රාදේශීය සභා සේවා | දර්ශක |
|---|---|
| ජලය | • ගුණාත්මක බව<br>• ප්‍රමුණාත්මක බව<br>• නඩත්තුව<br>• සමස්ත තෘප්තිය |
| කසළ | • සේවා ආවරණය<br>• එක්රැස් කිරීමේ ක්‍රමය<br>• බැහැර කරන ක්‍රම<br>• කලට වේලාවට එක්රැස් කිරීම<br>• සමස්ත තෘප්තිය |
| මාර්ග හා අතුරු මාර්ග | • වැසි දිනවල නඩත්තුව/අලුත්වැඩියාව<br>• නඩත්තු කටයුතුවල ගුණාත්මක බව<br>• මඩ වළවල්වලින් තොරව මාර්ග පවත්වා ගැනීම<br>• සමස්ත තෘප්තිය |
| වීථි ලාම්පු | • වීථි ලාම්පු සංඛ්‍යාව<br>• ඇණ හිටීම්වලට ප්‍රතිචාර දැක්වීම<br>• වීථි ලාම්පුවල තීව්‍රතාව/දීප්තිය<br>• සමස්ත තෘප්තිය |
| කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම් | • කාණු පිරිසිදු සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට ගත වන කාලය<br>• නඩත්තුව<br>• ඉදි කිරීම<br>• සමස්ත තෘප්තිය |
| ක්‍රීඩාංගණ | • ක්‍රීඩාංගණය වෙත ප්‍රවේශය<br>• ආරක්ෂක පියවර<br>• පිරිසිදුකම<br>• පවත්නා පහසුකම්<br>• සමස්ත තෘප්තිය |
| පුස්තකාලය | • විවෘත කෙරෙන වේලාව<br>• නඩත්තුව<br>• මෑත කාලීන ප්‍රකාශන පැවතීම<br>• පවත්නා පහසුකම් |

## 1.6. අධ්‍යයන ප්‍රදේශය

**මුලතිවු දිස්ත්‍රික්කයේ දී මෙම අධ්‍යයනය මැරිටයිම්පත්තු, ඔට්ටුසුඩාන් හා වැලිඔය** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය සභා සහ කලාප අධ්‍යාපන කාර්යාල යටතේ පවත්නා ප්‍රදේශ ගණනාවක් ආවරණය කරන බව පහත වගුවෙන් පෙනේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ප්‍රාදේශීය සභාව | යෝජිත ග්‍රාම නිලධාරි වසම්වල නම් | ගම්මාන සංඛ්‍යාව | කුටුම්බ සංඛ්‍යාව |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| මැරිටයිම්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාව/මුලතිවු කලාප අධ්‍යාපන කාර්යාලය | වට්ට්‍රාපලෙයි | 2 | 443 |
| | කල්ලපාඩු දකුණ | 2 | 517 |
| | සෙල්වපුරම් | 1 | 437 |
| | මාමූලෙයි | 2 | 375 |
| | කේප්පපිලවු | 2 | 390 |
| | මුල්ලිවයික්කාල් නැගෙනහිර | 2 | 464 |
| | මුල්ලිවයික්කාල් බටහිර | 2 | 331 |
| | සිලාවත්තෙයි | 3 | 475 |
| | මුල්ලියවලෙයි උතුර | 2 | 336 |
| | මුලතිවු දකුණ | 2 | 276 |
| ඔට්ටුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/පුදුකුඩිරිප්පු ප්‍රාදේශීය සභාව/තුනුක්කායි කලාප අධ්‍යාපන කාර්යාලය | මුත්තයියන්කට්ටු කුලම් | 4 | 376 |
| | කට්සිලෙයිමඩු | 3 | 303 |
| | ඔට්ටුසුඩාන් | 5 | 355 |
| | විත්‍යාපුරම් | 2 | 259 |
| | මාන්කුලම් | 6 | 681 |
| | තිරුමුරුකන්ඩි | 5 | 403 |
| | ඊන්දුපුරම් | 2 | 400 |
| වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාව/මුලතිවු කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ පවත්නා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල | නිකවැව දකුණ | 2 | 577 |
| | ඝනකපුර | 4 | 673 |
| | කිරිඉබ්බන් වැව | 1 | 367 |

# 2. ප්‍රධාන සොයා ගැනීම්

## 2.1. සේවාවන් පැවතීම, ප්‍රවේශය හා භාවිතය


මෙම විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය ජල සම්පාදන සේවාවන්, කාණු පද්ධතිය, කසළ එක්රැස් කිරීම, ප්‍රවේශ මාර්ග හා අතුරු මාර්ග, වීථි ආලෝක කිරීම, ක්‍රීඩාංගණ හා පුස්තකාල පහසුකම් යන තෝරා ගත් සේවාවන් හතේ පැවතීම හා භාවිතය පිළිබඳ දත්ත රැස් කළේ ය. මින් පසුව එන කොටස් පිලිවෙලින්, 2018 පෙබරවාරි - සැප්තැම්බර් කාලය අතරතුර, සමීක්ෂණයට ලක් කරන ලද ඒ ඒ සේවා අංශය වෙත පවත්නා මහජන ප්‍රවේශය සාකච්ඡාවට ලක් කෙරෙයි. 2018 මැයි මාසයේ සිට සප්තැම්බර් මාසය දක්වා කාලය තුළ මෙම අංශයන්ගේ සිදු වූ ප්‍රගතිය මේ ආශ්‍රිතව විමසා බලනු ලැබේ. පළමු සමීක්ෂණයේ දත්තයන් **පළමු** (**Wave 1**) යන්නෙන් පෙන්නුම් කරයි. දෙවන සමීක්ෂණයේ දත්තයන් **දෙවන** (**Wave 2**) යන්නෙන් පෙන්නුම් කරෙන අතර මෙහිදී දෙවන සමීක්ෂණයේ ප්‍රතිඵල පළමු සමීක්ෂණයට සාපේක්ෂව විශ්ලේෂණය කෙරේ.

**පානීය ජලය**

1 වැනි රූප සටහන මඟින් පෙන්නුම් කරන පරිදි මෙරිටයිම්පට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය සභා බලප්‍රදේශ වල පානීය ජල සැපයුමෙහි සැළකිය යුතු දියුණුවක් දක්නට ලැබෙන අතර සලකා බලන පහසුකම ලබන පවුල් සංඛ්‍යාවෙහි දෙගුණ වීමක් පසුගිය මාස කිහිපය තුළ වාර්තා වී තිබේ. ඔට්ටුසුඩාන් ප්‍රදේශය ඉහළම අගය වාර්තා කරන අතර, වර්තමානය වන විට පානීය ජලය සඳහා ප්‍රවේශය පවතින නිවාස ගණන 46% ඉක්මවයි. වැලිඔය ප්‍රදේශය තුළ එක් අතෙකින් පානීය ජල පහසුකම පවතින පවුල් සංඛ්‍යාව පළමු සමීක්ෂණයට සාපේක්ෂව සියයට 17% සිට 6% පමණ දක්වා (දෙවන සමීක්ෂණ කාල සීමාවේ) අඩු වීමක් පෙන්නුම් කරයි. එයට විශේෂිත එක් හේතුවක් වන්නේ වැලිඔය ප්‍රාදේශීය බලප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාවට වඩා මහවැලි අධිකාරිය විසින් ජල සැපයීම ආශ්‍රිත පහසුකම් සලසන නිසාය. එමෙන්ම අනෙක් කරුණ වන්නේ දෙවන සමීක්ෂණ කාල සීමාවේදී ප්‍රදේශයේ පැවති අධික නියඟය හේතු කර ගනිමින් නිවාස සඳහා පවතින ජල සැපයුමේ පැවති හඟතාවයයි.

ප්‍රාදේශීය සභා තුළින් නල මඟින් සපයන ජලය තුලින් පමණක්ම පවුල්වල ජල සැපයුම සපුරා ගනු නොලබන අතර, ග්‍රාමීය සංවිධාන මඟින් ප්‍රතිපාදන සපයමින් ඉදි කරන ලද ප්‍රජාමූල ජල යෝජනා ක්‍රම මඟින්ද ජල අවශ්‍යතාව සපුරාගනු ලැබේ.

**1 වැනි රූප සටහන : ජලය පැවතීම හා භාවිතය**




**මාර්ග සහ අතුරු මාර්ග**

**2 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන පරිදි ඔට්ටුසුඩාන් සහ මෙරිටයිම් පට්ටු ප්‍රදේශයේ පවතින මාර්ග හා අතුරු මාර්ග පහසුකම සැලකියයුතු ලෙස ඉහල යාමක් පසුගිය මාස කිහිපය ඇසුරෙන් හඳුනා ගැනීමට හැකියාව තිබේ. ඒ අනුව 80%කටත් වැඩි නිවාස ප්‍රමාණයකින් තමන් වෙත මාර්ග හා අතුරු මාර්ග පහසුකම පවතින බව දෙවන සමීක්ෂණයට අනුව වාර්තා වී තිබේ.

මෙම තත්ත්වය සැලකිය යුතු වර්ධනයක් ලෙස සැලකිය හැකි අතර පළමු සමීක්ෂණයේදී වාර්තා වූ පරිදි ප්‍රාදේශීය බල ප්‍රදේශ දෙකෙහිම මාර්ග හා අතුරු මාර්ග පහසුකම් පිළිබඳව වාර්තා වී තිබුනේ 60% කට වඩා අඩු වෙනි. වැලිඔය ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා මාර්ග සහ අතුරු මාර්ග පිළිබඳව පළමු සමීක්ෂණයේ වාර්තා නොවුණු අතර, දෙවන සමීක්ෂණය වන විට 1% ක පමණ වර්ධනයක් පෙන්නුම් කරයි. විශේෂයෙන්ම වැලිඔය ප්‍රදේශයේ මාර්ග සහ අතුරු මාර්ග බොහොමයක මහවැලි අධිකාරිය මගින් නඩත්තු කිරීම මෙම තත්වයට හේතුවයි. විශේෂයෙන්ම 2018 වසරේ පෙබරවාරි මාසයේ පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් අනතුරුව වැලිඔය ප්‍රදේශයේ අලුතෙන්ම ප්‍රාදේශීය සභා ආරම්භ වීමත් එහි ක්‍රියාකාරීත්වය තවමත් මන්දගාමීව සිදුවීමත් අනෙක් හේතුවයි.


**2 වැනි රූප සටහන : මාර්ග හා අතුරු මාර්ග පැවතීම හා භාවිතය**




**වීථි ලාම්පු**

**3 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන පරිදි මැරිටයිම්පට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය බල ප්‍රදේශ වල වීථි ලාම්පු පහසුකම් පැවතීමේ සැලකියයුතු වර්ධනයක් පසුගිය මාස හතරක කාල සීමාව තුළ පෙන්නුම් කරයි. ඒ අනුව ප්‍රදේශ දෙකෙහිම පවුල් 60% කට ආසන්න ප්‍රමාණයක් තම ප්‍රදේශ වලට වීථි ලාම්පු පහසුකම පවතින බව වාර්තා කොට තිබේ. ඔට්ටුසුඩාන් ප්‍රදේශයේ විශේෂයෙන්ම සැලකියයුතු ලෙස වීථි ලාම්පු සේවාව වර්ධනය වීමක් දක්නට ලැබේ. විශේෂයන්ම පළමු සමීක්ෂණ කාල සීමාව තුල එම පහසුකම පවතින බව වාර්තා වුයේ 7% ක පමණ පවුල් ප්‍රමාණයකට වන අතර, දෙවන සමීක්ෂණය වන විට එම තත්ත්වය 60% දක්වා ඉහළ යාමක් පෙන්නුම් කර තිබේ. වැලිඔය ප්‍රදේශයේ මෙම වීථි ලාම්පු සේවාව පවතින බවට කිසිම කෙනෙකු දක්වා නොමැති අතර එම සේවාව ලබාදීමේ අවශ්‍යතාව ප්‍රදේශයේ ජනතාව සමීක්ෂණය අතරතුරදී අවධාරණය කරනු ලැබිණි. ඉහත දක්වන පරිදි 2018 වසරේ පෙබරවාරි මාසයේ අලුතෙන් පත්වන ලද ප්‍රාදේශීය සභාව තවදුරටත් ක්‍රියාකාරී මට්ටමට පත්වෙමින් පවතින අතර, සැලකිය යුතු ප්‍රගතියක් දක්නට නොලැබීම හේතුවක් ලෙස දැක්විය හැක. එම නිසා වැලිඔය ප්‍රදේශයට වීථි ලාම්පු සේවාව සැපයීමේ ප්‍රගතියක් ද දක්නට නැත.

3 වැනි රූප සටහන : වීදි ලාම්පු පැවතීම





## කසළ එක්රැස් කිරීමේ සේවා

**4 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරනු ලබන්නේ අධ්‍යයනයට ලක් කරන ලද ප්‍රදේශය තුළ කුණු කසල එකතු කිරීමේ සේවාවේ පැවතීම පිළිබඳවයි.

සමස්තයක් ලෙස සළකා බලන විට පළමු සමීක්ෂණ කාල සීමාවේදී ප්‍රාදේශීය සභා බලප්‍රදේශ තුළ මේ සේවාව ඉතා අවම අගයක් (16% පමණ) වාර්තා කර තිබේ. මෙම තත්වය තරමක ඉහළ යාමක් දෙවන සමීක්ෂණ කාල සීමාවේදී දක්නට ලැබේ. මැරිටයිම්පට්ටු ප්‍රදේශයේ 23%පමණ සේවාව දියුණුවක් සහ ඔට්ටු සුඩාන් ප්‍රදේශයේ 19% පමණ සේවාව පවතින බව දෙවන සමික්ෂය තුළින් පෙන්නුම් කරයි. එමෙන්ම වැලිඔය ප්‍රදේශය තුළ එම සේවාවේ සැලකිය යුතු වර්ධනයක් දක්නට නොලබෙන අතර 1% පමණ ජන ප්‍රතිශතයක් පවතින බව වාර්තා වී තිබේ. සාමාන්‍යයෙන් වැලිඔය දේශයේ කුණු කසල එකතු කිරීම යන්න මූලික ප්‍රශ්නයක් බවට පත් නොවී තිබෙන්නේ එම ප්‍රදේශයේ කසල බැහැර කිරීම සඳහා ඉඩකඩ පවතින නිසාය.

**4 වැනි රූප සටහන : කසළ එක්රැස් කිරීමේ සේවාවන් පැවතීම හා භාවිතය**




කෙසේ වුව ද කසළ එක්රැස් කිරීමේ සේවාවන් නොපැවතීම අවබෝධ කර ගත යුත්තේ පර්චස් 20ට වැඩි ඉඩම්වල පිහිටි නිවාසවලින් දිරා පත් වන කසළ එක්රැස් නොකෙරෙන බවට රජය විසින් මෑත කාලයේ චක්‍රලේඛයක් නිකුත් කෙරී ඇති බව සැලකිල්ලට ගනිමිනි. සමහර ප්‍රදේශවල කසළ එක්රැස් කිරීමක් සිදු නොවන්නේ


මෙම ග්‍රාමීය කුටුම්බවලින් බොහොමයක් සතුව තිබෙන්නේ පර්චස් 20ට වැඩි ඉඩම් නිසා විය හැකි ය. සමහර කුටුම්බ සිය ලිප් දැල්වීම සඳහා පොලිතීන් හා ප්ලාස්ටික් දවන බව ද සඳහන් කළ යුතු ය. සෞඛ්‍යය සම්බන්ධයෙන් ගත් කල ප්ලාස්ටික් පිලිස්සෙන විට නගින විෂ දුම් නිසා සෞඛ්‍ය අවදානමක් ඇති විය හැකි අතර, විධිමත් කසළ කළමනාකරණ ක්‍රම පිළිබඳව මහජනයාට අධ්‍යාපනය ලබා දීම සඳහා ප්‍රමාණවත් දැනුවත්කමක් ඇති කළ යුතු ය.

**පුස්තකාල පහසුකම්**

**5 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරනු ලබන පරිදි පුස්තකාල පහසුකම් වල සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර තිබේ. ඒ අනුව අවම වශයෙන් පුස්තකාල සේවය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බලප්‍රදේශ වල පුද්ගලයන් වෙත පවතින ප්‍රවේශය ඉහල යාමක් දෙවන සමීක්ෂණය ඇසුරෙන් පෙන්නුම් කරයි.

සාපේක්ෂව වැලිඔය ප්‍රදේශයේ සැලකිය යුතු ලෙස පුස්තකාල සේවාව සඳහා පවතින ප්‍රවේශයේ ඉහළ යාමක් දක්නට ලැබේ. 3%ක පමණ අඩු තත්වයක් පළමු සමීක්ෂණයේදී පෙන්නුම් කරනු ලැබූ තත්වය, දෙවන සමීක්ෂණය වන විට 71% දක්වා පුස්තකාල පහසුකම් පවතින බවට ප්‍රතිචාර දක්වා තිබීම විශේෂ වේ. විශේෂයෙන්ම මෙම ඉහළ යාම සඳහා හේතු වශයෙන් හඳුනාගත හැකි වන්නේ ඇතැම් කුටුම්බයන් විසින් පාසලේ පවතින පුස්තකාල පහසුකම් පිළිබඳව සළකා පිළිතුරු ලබා දීමත්, සාපේක්ෂව ප්‍රාදේශීය සභා පුස්තකාල තිබීම අනිවාර්ය නොවන අතර, පාසලේ පුස්තකාලයෙන් වුවද තම දරුවනේ කියවීමේ අවස්ථා සඳහා ඉඩ කඩ ලැබීම මෙහිදී ඔවුන්ගේ අවධානයට යොමුව තිබේ. එම හේතුව නිසා පුස්තකාල සේවා පැවතීමේ ප්‍රතිශතය ඉහළ අගයක පිහිටයි.

**5 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පැවතීම හා භාවිතය**





**කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම්**

**6 වැනි රූප සටහන** මගින් ජලාපවහන පහසුකම් (කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම්) වෙත ප්‍රවේශ වන්නේ හා භාවිත කරන්නන්ගේ ප්‍රතිචාර පෙන්වා දෙයි.

ඒ අනුව 15%කට වඩා අඩු පවුල් ප්‍රමාණයක් කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම් පවතින බව පළමු සමීක්ෂණයේදී පෙන්වා දී තිබුණු අතර දෙවන පුරවැසිපත් සමීක්ෂණයෙදී මෙරිටයිම් පට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රදේශයන් හි සැලකියයුතු පවුල් ප්‍රතිශතයක් කානු පද්ධතිය පිළිබඳව සිය ප්‍රතිචාරය ලබා දී තිබේ. ඒ අනුව ප්‍රාදේශීය සභා විසින් වැසි සහිත කාල සීමා වලදී කාණු සම්බන්ධයෙන් දක්වන අවධානය පිළිබඳව ප්‍රතිචාරය පවුල් වලින් දක්වන ලද ප්‍රතිචාර ඉහල යාමට හේතු වී තිබේ. කෙසේ වෙතත් වැලිඔය ප්‍රාදේශීය බල ප්‍රදේශයේ 1% ක පමණ අඩු ප්‍රතිශතයක් කාණු පවතින බවට ප්‍රතිචාර දක්වා තිබේ. එයට හේතුවක් බවට පත් වන්නේ එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව අලුතෙන් පත් වී තිබීම සහ කාණු පද්ධතියේ සංවර්ධන කටයුතු ඉතා අවම මට්ටමකින් ආරම්භ

වී තිබීම බව ජනතාවගේ මතයයි. වැලිඔය ප්‍රදේශයේද බොහොමයක් පවුල් වලට කාණු පද්ධතිය ආශ්‍රිත පහසුකම් සංවර්ධනය යන්න පැවති නියග කාල සීමාව තුල මූලික අවශ්‍යතාවක් ලෙස ඉස්මතු නොවිණි.


**6 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පැවතීම හා භාවිතය**




**ක්‍රීඩාංගණ**

**7 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරනු ලබන පරිදි සලකා බලන ලද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුනෙහිම ක්‍රීඩා පිට්ටනි සඳහා තිබෙන ප්‍රවේශයෙහි ඉහල යාමක් පසුගිය මාස හතර තුළ දක්නට ලැබේ. ඒ අනුව එම තත්වය දෙවන සමීක්ෂණය පවත්වන ලද කාල සීමාව වන විට මැරිටයිම් පට්ටු ප්‍රදේශයේ 82% ක් පමණ වේ. විශේෂයෙන්ම දේශපාලන නියෝජිතයින් විසින් දේශපාලන උත්සව සහ අනෙකුත් පොදු උත්සව සඳහා ක්‍රීඩා පිට්ටනි දියුණු කිරීමේ වැඩි කැමැත්තක් දක්වන බව වාර්තා විය. අප්‍රේල් සහ මැයි යන මාස වලදී උදාවන උත්සව සඳහා මෙම ක්‍රීඩා පිට්ටනි සංවර්ධනය කිරීම නිසා බොහෝ විට ප්‍රදේශ වාසින් වෙත ක්‍රීඩා පිට්ටනිය භාවිතා කිරීමේ ඉඩකඩ උදා වේ. වැලිඔය ප්‍රදේශයේ ඉතා විශාල වර්ධනයක් දක්නට නොලැබෙන අතර ඉතා කුඩා ප්‍රතිශතයකින් ක්‍රීඩා පිට්ටනි සඳහා පවතින ප්‍රවේශය ඉහළ ගොස් තිබෙන බව පෙනී යයි. මැරිටයිම් පට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය බලප්‍රදේශ අතර දෙවන සමීක්ෂණයට අනුව 16%ක පමණ ක්‍රීඩා පිට්ටනි සඳහා පවතින ප්‍රවේශයේ වෙනස් කමක් හඳුනා ගත හැකිය. ඒ අනුව මැරිටයිම් පට්ටු ප්‍රදේශයේ ඔට්ටුසුඩාන් වලට සාපේක්ෂව 16% කින් පහසුකම වර්ධනය වී තිබේ.

**7 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පැවතීම හා භාවිතය**



**පොදු නිරීක්ෂණය**

ඉහත සාකච්ඡාවට ලක් කරන ලද පරිදි ප්‍රාදේශීය සභාවන් ආශ්‍රිත පොදු සේවා සැපයීමේ සැලකියයුතු වෙනස්කම් ප්‍රාදේශීය බලප්‍රදේශයන් තුනෙහිම හඳුනා ගත හැකිවේ. විශේෂයෙන්ම මෙහිදී වැදගත් කරුණ වන්නේ මෙම වෙනස්කම් සිදුවීම කෙරෙහි 2018 පෙබරවාරි මස පවත්වන ලද පළාත්පාලන මැතිවරණය මඟින් තේරී පත් වූ නියෝජිතයන්ගේ මැදිහත්වීම හා ජනතාවගේ අවශ්‍යතා පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කිරීම යන හේතු බලපානු ලැබීමයි.

## 2.2. සේවාවන් පිළිබඳ සමස්ත තෘප්තිය


මෙම සමීක්ෂණය ඉහත සාකච්ඡාවට ලක් කරන ලද තෝරා ගත් රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන්ගේ තෘප්තියේ මට්ටම් පිළිබඳ දත්ත ද රැස් කළේ ය. ඒ අනුව පහත සාකච්ඡා වලදී, **පළමු සමීක්ෂණය** ඇසුරෙන් ලබා ගන්නා ලද තොරතුරු වලට අදාළ දත්ත **පළමු** යන්නෙන් පෙන්නුම් කරනු ලබන අතර **දෙවන** යන්නෙන් පෙන්නුම් කරනු ලබන්නේ **දෙවන සමීක්ෂණය** තුලින් ලබා ගන්න ලද දත්තයන් වේ. එමෙන්ම පහත දැක්වෙන රූප සටහන මගින් පෙන්නුම් කරන්නේ අදාළ සේවාව පාරිභෝජනය සම්බන්දයෙන් මහජනයා තුල පවතින ඉහළ තෘප්ති මට්ටමයි.

**ජලය**

**8 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන පරිදි මැරිටයිම්පට්ටු ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පානීය ජලය සැපයුම පිළිබඳව ජනතා තෘප්ති මට්ටම පළමු සමීක්ෂණයේදී වාර්තා වූ මට්ටමට සමානවම දෙවන සමීක්ෂනයේදීත් පෙන්නුම් කරයි. ඒ අනුව ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ ජල පහසුකම ලබා ගන්නන්ගෙන් ඉතා ඉහළ තෘප්ති මට්ටමේ සිටින ප්‍රමාණය සමස්ත ප්‍රමාණයෙන් හතරෙන් එකකට ආසන්න බව පෙනී යයි. ඔට්ටුසුඩාන් ප්‍රදේශයේ පළමු සමීක්ෂණයේදී වාර්තා වූ 65% පමණ තෘප්ති මට්ටම දෙවන සමීක්ෂණ කාල සීමාවේදී 32% දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි. මෙම තත්වයට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ පවතී දැඩි නියගය නිසා ප්‍රදේශයේ ජල හිඟයක් පැවතීමයි.

වැලිඔය ප්‍රදේශයේ තෘප්ති මට්ටමෙහිද පළමු සමීක්ෂණයේදී 21%ක් ව පැවති ඉහළ තෘප්ති මට්ටම අවම මට්ටම දක්වා දෙවන සමීක්ෂණයේදී අඩුවී තිබේ. ඒ අනුව ජාල සැපයුම පිළිබඳ ඉතා අතෘප්ති මට්ටමක පවතින බව පෙනී යයි. වැලිඔය ප්‍රදේශයේ පවා ජාල සැපයුම පිළිබඳව පවතී තෘප්ති මට්ටම අඩු වීමට බලපාන ලද ප්‍රධාන හේතුව බවට පත්ව තිබෙන්නේ දෙවන සමීක්ෂණ කාල සීමාවේදී එම ප්‍රදේශයේ පැවති නියඟය සහ ජල හිඟයයි.

**8 වැනි රූප සටහන : ජල සම්පාදන සේවාවන් පිළිබඳ තෘප්තිය**




**මාර්ග හා අතුරු මාර්ග**

මැරිටයිම්පට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය සභා බලප්‍රදේශ වල මාර්ග හා අතුරු මාර්ග සම්බන්ධයෙන් ජනතාව තුල පවතින තෘප්ති මට්ටමේ සාමාන්‍ය ඉහල යාමක් වාර්තා වන අතර, දෙවන සමීක්ෂණ කාල සීමාව තුළ ප්‍රදේශයේ මාර්ග ඇතුළු යටිතල පහසුකම් වර්ධනය වීමක් ඒ අනුව දක්නට ලැබේ.

**9 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරනු ලබන්නේ මාර්ග හා අතුරු මාර්ග පිළිබඳව ජනතාවගේ තෘප්ති මට්ටමේ වෙනස් වීමයි.

**9 වැනි රූප සටහන : මාර්ග පිළිබඳ තෘප්තිය**




මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවක් ව පවතින්නේ නව ප්‍රාදේශීය සභා සඳහා තේරී පත් වූ නියෝජිතයන් විසින් ප්‍රදේශයේ මාර්ග පිළිසකර කිරීම සඳහා අවධානය යොමු කිරීමයි. වැලිඔය ප්‍රදේශයේ ප්‍රතිචාර දැක්වූවන් විසින් මාර්ග පිළිබඳව ඉහළ තෘප්ති මට්ටම පිළිබඳව වාර්තා කර නැත.

විශේෂයෙන් ම මාර්ග හා අතුරු මාර්ග ඉදි කිරීම හා නඩත්තුව සම්බන්ධයෙන් සැලකිය යුතු හිඟයක් දක්නට ලැබෙන අතර, වැලිඔය ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය සභාවට අනුබද්ධව සිදු වීමේ අඩුවක් දක්නට ලැබෙන්නේ එම ප්‍රාදේශීය සභාව 2018 පෙබරවාරි මාසයේ සිට අලුතෙන් ආරම්භ වීමත්, එහි ක්‍රියාකාරිත්වය මන්දගාමීව සිදුවීමත් යන හේතු මතය. විශේෂයෙන්ම මහවැලි අධිකාරිය මැදිහත්ව මාර්ග ඉදිකිරිම හා යටිතල පහසුකම් සංවර්ධනය සිදු වේ.

එම මාර්ග ප්‍රාදේශීය සභා මගින් සපයන ව්‍යාපෘති යටතට වන මෙම මාර්ග කාණ්ඩයේ ග්‍රාමීය මාර්ග ලෙස සළකා ප්‍රාදේශීය සභා යටතට ඇතුලත් කර නැත.


**වීදි ආලෝකය**

**10 වැනි රූප සටහන** ඇසුරෙන් පෙන්නුම් කරන පරිදි මැරිටයිපට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වල වීථි ලාම්පු පිළිබඳව ජනතාවගේ තෘප්ති මට්ටම සැළකිය යුතු මට්ටමක පහල යාමක් දෙවන සමීක්ෂණ කාල සීමාව තුළ දක්නට ලැබේ. මෙම ප්‍රදේශයන්හි වීදි ලාම්පු සඳහා ජනතාවට තිබෙන ප්‍රවේශය දෙවන සමීක්ෂණ කාල සීමාවේදී ඉහළ ගියද (**3 වැනි රූප සටහන බලන්න**) තෘප්ති මට්ටමේ සැලකියයුතු ඉහළ යාමක් දක්නට නොලැබේ.

මෙම වෙනස්කම කෙරෙහි බලපාන ලද තවත් කරුණක් වන්නේ ග්‍රාමීය මට්ටමේ වීථි ලාම්පු සේවාව ජනතාව විසින් නාගරික පරිසරයක පවතින වීථි ලාම්පු සේවාව සමග සංසන්දනය කිරීම යි. ඒ අනුව නගරයට සාපේක්ෂව ග්‍රාමීය මට්ටමට සේවාව සැපයීමේ අඩුවක් පවතින බව පෙනීයයි. ඔට්ටුසුඩාන් ප්‍රදේශයේ කිසිදු පුද්ගලයකු වත් ඉහළ තෘප්ති මට්ටමක් මාර්ග ආශ්‍රිත වීථි ලාම්පු සේවාව පිළිබඳව දක්වා නැත. සමස්තයක් ලෙස

බලන විට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයන් තුනෙහිම වීථි ලාම්පු සේවාව සැපයීමේ හිඟකමකින් පෙලෙන බවත්, එම සේවාව තවදුරටත් වර්ධනය කිරීමේ අවශ්‍යතාවත් ඉස්මතු වේ.

**10 වැනි රූප සටහන : වීදි ආලෝකය පිළිබඳ තෘප්තිය**





## පුස්තකාල පහසුකම්

**11 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන පරිදි මැරිටයිම්පට්ටු ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පුස්තකාල පහසුකම් භාවිත කරන්නන්ගේ තෘප්ති මට්ටමේ සැලකියයුතු ඉහළ යාමක් පෙන්නුම් කරයි. ඒ අනුව දෙවන සමීක්ෂණ කාල සීමාව තුළ 26%ක තෘප්ති මට්ටමක් පෙන්නුම් කරයි. ඔට්ටුසුඩාන් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ 31% පමණ පවුල් සංඛ්‍යාවක් දෙවන සමීක්ෂණ කාල සීමාවේදී තමා ලබන පුස්තකාල පහසුකම් පිළිබඳ ඉහළ තෘප්ති මට්ටමක් වාර්තා කර තිබෙන අතර, එය පළමු සමීක්ෂණයේදී වාර්තා වූ මට්ටමට වඩා තරමක අඩු වීමකි.

වැලිඔය කලාපයට අනුව පුස්තකාල පහසුකම් භාවිතයේ කිසියම් ඉහළ යාමක් පෙන්නුම් කරනු ලැබුවත් එම සේවාව භාවිතයෙන් ඉතා ඉහල තෘප්තිමත් වන බව කිසිවෙකු වාර්තා කර නැත. මෙම තෘප්තිමත් බව සලකා බලන ලද්දේ සේවාවේ පැවතීම, ගුණාත්මක බව, අදාළ සේවාව භාවිතය හෝ ජනතාවට ඇති අදාළ බව යන්න සළකා බැලීමෙනි. ඉතා අඩු තෘප්තිමත් බව වාර්තා වීම කෙරෙහිද ඉහත දක්වන ලද නිර්ණායකයන් ඔස්සේ ජනතාව අනෙකුත් පුස්තකාල පහසුකම් පිළිබඳ සලකා බලා ලබා දෙන ලද පිළිතුරු හේතු වී තිබේ.


**11 වැනි රූප සටහන : පුස්තකාල පහසුකම් පිළිබඳ තෘප්තිය**



**ජලාපවහන පහසුකම්**

**12 වැනි රූප සටහන** ට අනුව කානු පද්ධතිය ආශ්‍රිත පහසුකම් ආශ්‍රිත තෘප්ති මට්ටම සැලකියයුතු ලෙස ඉහල යාමක් ඔට්ටුසුඩාන් ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇසුරෙන් හඳුනාගත හැකි අතර දෙවන සමීක්ෂණයේ දත්ත අනුව මැරිටයිම් පට්ටු ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තෘප්ති මට්ටම අඩුවීමක් පෙන්නුම් කරයි. එමෙන්ම වැලිඔය ප්‍රදේශයේ තෘප්ති මට්ටමෙහි වෙනස්වීමක් පෙන්නුම් නොකරයි.

**12 වැනි රූප සටහන : ජලාපවහන පහසුකම් පිළිබඳ තෘප්තිය**





ඔට්ටුසුඩාන් ප්‍රාදේශීය සභාව විසින් පවතින වැසි සහිත කාලගුණික තත්වයද සැලකිල්ලට ගනිමින් කාණු ආශ්‍රිත පහසුකම් සංවර්ධනය කිරීමක් සමග සේවාවේ තෘප්ති මට්ටමේ ඉහල යාමක් පෙන්නුම් කරන අතර, මැරිටයිම්පට්ටු ප්‍රදේශයේ ජනතාවගේ තෘප්ති මට්ටමේ සැලකියයුතු වෙනසක් දක්නට නොලැබේ. මුලින් සඳහන් කරන ලද පරිදි පැවති නියඟ කාල සීමාව නිසා වැලිඔය ප්‍රදේශයේ කාණු පද්ධතිය පිළිබඳ වැඩි අවධානයක් හා ප්‍රමුඛතාවයක් ඇති නොවූ නිසා වැලිඔය ප්‍රදේශයේ කානු පද්ධතිය ආශ්‍රිත පහසුකම් පිළිබඳ තෘප්ති මට්ටමේ වෙනසක් වී නොමැත.

**ක්‍රීඩාංගණ**

**13 වැනි රූප සටහන** ඇසුරෙන් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රාදේශීය සභාව මගින් සැපයෙන ක්‍රීඩා පිට්ටනි භාවිතය හා ඒ ආශ්‍රිත තෘප්ති මට්ටමයි.

**13 වැනි රූප සටහන : ක්‍රීඩාංගණ පහසුකම් පිළිබඳ තෘප්තිය**



ඒ අනුව වැලිඔය සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය සභා බලප්‍රදේශ වල තෘප්ති මට්ටම අඩු වීමක් පෙන්නුම් කරනු ලබන අතර මැරිටයිම්පට්ටු ප්‍රදේශයේ කිසිඳු වර්ධනයක් පෙන්නුම් නොකරයි. මේ සඳහා ප්‍රදේශයේ පවතී කාලගුණික තත්වයන් මෙන්ම, එම ක්‍රීඩා පිට්ටනි නඩත්තු කිරීම ආශ්‍රිත ගැටළු ද හේතු වී තිබේ.

**කසළ එක්රැස් කිරීම**


ග්‍රාම නිලධාරි වසම් බොහොමයක කසළ එක්රැස් කිරීමේ සේවාවන් ක්‍රියාත්මක වන්නේ සීමිත වශයෙන් බැවින් තෘප්තියේ මට්ටම් පිළිබඳව විශ්ලේෂණයක් කර නැත.

# 2.3. සැඟවුණු වියදම්[1]

## 2.3.1. සේවාවන් ලබා ගැනීම සඳහා දැරූ වියදම්

විවිධ සේවාවන් ලබා ගැනීම සඳහා මහජනතාවට දැරීමට සිදුව ඇති සැඟවුණු පිරිවැය පිළිබඳ සමීක්ෂණය මගින් සොයා බලනු ලැබීය. සැඟවුණු වියදම්වල ස්වභාවය හා එවැනි වියදම් දැරීමට සිදු වන බව අවබෝධ කර ගැනීම මඟින් මෙම වියදම් නීත්‍යනුකූල ද නැතහොත් අවශ්‍ය ද යන්න තීරණය කිරීමේ ක්‍රමයක් බලධාරීන් වෙත සම්පාදනය කළ හැකි ය.

**14 වැනි රූප සටහන : සේවාවන් ලබා ගන්නා විට දැරීමට සිදු වන සැඟවුණු වියදම්**




පළමු සහ දෙවන සමීක්ෂණය අතරතුර කාලය තුල සැලකියයුතු පවුල් ප්‍රමාණයක් විසින් තමන්ට සේවා ලබා ගැනීම වෙනුවෙන් මුදලක් හෝ වෙනත් පිරිවැයක් දැරීමට සිදු නොවන බව වාර්තා කර තිබෙන අතර එහෙත් ඇතැම් පවුල් වලින් ලද ප්‍රතිචාර අනුව සේවා ලබා ගැනීමට අතිරේක පිරිවැයක් දැරීමට සිදු වන බව (**14 වැනි රූප සටහන පරිදි**) වාර්තා වේ. ඇතැම් පවුල් විසින් තමන් ලබා ගන්න ප්‍රාදේශීය සභා සේවා සඳහා අමතර ගෙවීමක් කිරීමට සිදුවන බව පෙන්වා දී තිබේ. ඒ අනුව විමසා බැලීමේදී පවුල් වෙතින් සේවා ලබා ගැනීමට සිදු කරනු ලබන ගෙවීම් සැලකියයුතු අඩු මට්ටමක පැවතුනත්, එම තත්වය අධ්‍යයනය කිරීමේදී එක් එක් සේවා

[1] ඍජුව නොපෙනෙන, වියදමක් නොවන එහෙත් වක්‍රාකාරයෙන් කළයුතු වියදම්

සඳහා අමතර ගෙවීමක් කිරීමට සිදුවන බව දක්වන ලද ප්‍රතිචාර පහත පරිදි පෙන්වා දිය හැකිය. ජල සැපයුම සඳහා 16 දෙනෙක්, පුස්තකාල පහසුකම් සඳහා 08ක්, මාර්ග ආශ්‍රිත යටිතල පහසුකම් සඳහා 02ක්, වීථි ලාම්පු සඳහා 01ක් හා කානු පද්ධතිය සඳහා 01ක් වශයෙන් සේවා ලබා ගැනීමට අතිරේක පිරිවැයක් දැරීමට වන බව වාර්තා කර තිබේ.

වීථි ලාම්පු සේවාව සඳහා වන පිරිවැය සළකා බැලීමේදී, ප්‍රාදේශීය සභා වීථි ලාම්පු සේවාව තම ප්‍රදේශයට නොලැබෙන හෙයින්, ඇතැම් පවුල් විසින් සිය නිවසෙන් විදුලිය ලබා ගනිමින් මාර්ගයේ ලාම්පු දල්වයි. ඒ හේතුවෙන් ඔවුන්ට පිරිවැයක් වන බව වාර්තා විය. මාර්ග සඳහා වන අතිරේක පිරිවැය වන්නේ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පැමිණෙන ශ්‍රමිකයන්ට තේ පැන් ආදිය සැපයීමට ඇතැම් අවස්ථා වලදී දැරීමට වන පිරිවැයයි. එමෙන්ම ජලය සැපයීම ආදිය සඳහා වන පිරිවැය ලෙස වාර්තා කර තිබෙන්නේ ජලය භාවිත කිරීමේදී අදාළ බිල්පත සඳහා දැරීමට වන ගාස්තුව වන අතර පුස්තකාල සේවා භාවිතයේදී ද එම පිරිවැය අදාළ වේ.


කාණු පද්ධතිය ආශ්‍රිතව දැරීමට සිදුවන පිරිවැය ලෙස හඳුනා ගත හැකි වන්නේ ඇතැම් නිවාස හිමියන් විසින් තම වියදමින් සිය ඉඩමේ සිට ප්‍රධාන කාණුවට සම්බන්ධ කිරීමට ජල නල ආදිය සවි කිරීම සඳහා දරන පිරිවැය යි. එමෙන්ම මෙම සේවා ලබා ගැනීමට ජනතාවට සිදුවන පිරිවැය සහ ඒ ආශ්‍රිත ගැටළු සළකා බලා කෙසේ, කුමන ප්‍රදේශයට අවශ්‍ය සේවාව සපයන්නේද යන්න තීරණය කිරීමට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තොරතුරු සපයයි. කාණු පද්ධතිය ආශ්‍රිතව දැරීමට සිදුවන පිරිවැය ලෙස හඳුනා ගත හැකි වන්නේ ඇතැම් නිවාස හිමියන් විසින් තම වියදමින් සිය ඉඩමේ සිට ප්‍රධාන කාණු වලට සම්බන්ධ කිරීමට ජල නල ආදිය සවි කිරීම සඳහා දරන පිරිවැය යි. එමෙන්ම මෙම සේවා ලබා ගැනීමට ජනතාවට සිදුවන පිරිවැය සහ ඒ ආශ්‍රිත ගැටළු සළකා බලා කෙසේ, කුමන ප්‍රදේශයට අවශ්‍ය සේවාව සපයන්නේද යන්න තීරණය කිරීමට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තොරතුරු සපයයි.

## 2.3.2. පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දක්වනසුලු බව


**15 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන්නේ පොදු සේවා සහ ඒ පිලිබඳ වන ගැටළු පැමිණිලි සඳහා ප්‍රාදේශීය සභා වෙතින් සපයන ලද ප්‍රතිචාරය පිළිබඳව ය. ඔට්ටුසුඩාන් ප්‍රදේශයේ සමස්ත ප්‍රතිචාර දක්වූවන්ගෙන් භාගයක් පමණ සඳහන් කරන්නේ තමන්ගේ පැමිණිලි සඳහා කිසියම් ප්‍රතිචාරයක් ලැබුණු බවයි. මැරිටයිම් පට්ටු සහ වැලිඔය ප්‍රදේශ වල ජනතා පැමිණිලි සඳහා ලැබුණු ප්‍රතිචාරය තරමක 30% හා 40% මට්ටමක වාර්තා වේ. එම ගැටළු සඳහා ලැබුණු ඇතැම් ප්‍රතිචාර ඉතා කණගාටුදායක බවද ප්‍රතිචාර දක්වූවන්ගේ මතයයි.

කෙසේ වෙතත් දෙවන සමීක්ෂණය අතුරතුර කාල සීමාවේදී සැලකියයුතු පැමිණිළි ප්‍රමාණයකට යහපත් ප්‍රතිචාර ලැබී තිබෙන බව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුනෙන්ම වාර්තා වේ.

**15 වැනි රූප සටහන : පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දැක්වීම**



**16 වැනි රූප සටහන : පැමිණිලි/දුක් ගැනවිලි සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ තෘප්තිය**




**16 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන්නේ තමන් විසින් ප්‍රාදේශීය සභා වෙත සේවා පිළිබඳ කරන ලද පැමිණිලි හා ඉල්ලීම් වලට තමන් වෙත එම ආයතන වලින් ලැබුණු ප්‍රතිචාරයන් පිළිබඳ තෘප්ති මට්ටමයි. ඒ අනුව අධ්‍යනයේදී පෙනී යන්නේ තමා වෙත ආයතන වෙතින් ලැබුණු ප්‍රතිචාර පිළිබඳව ඉතා ඉහල තෘප්ති මට්ටමට පත්වන පිරිස ප්‍රාදේශීය සභා බලප්‍රදේශ තුනෙහිම ඉතාම අඩු අගයක් වන බවයි. මෙම තත්වය තුලින් පෙන්නුම් කරන ඉතා වැදගත් තත්වයක් වන්නේ සේවා සපයන ආයතන හා නිලධාරීන් විසින් ජනතාවගේ ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීමත්, ක්‍රියාත්මක වීමත් ඉතා මන්දගාමීව සිදු වන බවයි.

# 3. සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය

**17 වැනි රූප සටහන** මුලතිවු දිස්ත්‍රික්කයේ දී සමීක්ෂණයට ලක් කරන ලද ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන තෝරා ගත් රාජ්‍ය සේවාවන්ගේ කාර්ය සාධනය සඳහා ලබා දෙන ලද ලකුණු ප්‍රමාණය දක්වයි. අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටි සෑම ග්‍රාම නිලධාරි වසමක ම රාජ්‍ය සේවා කාර්ය සාධනය සඳහා ලකුණු ලබා දෙන අතර ඒ සඳහා පදනම් කර ගන්නේ සමීක්ෂණයට ලක් කරන ලද රාජ්‍ය සේවාවන් පිළිබඳව තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ ප්‍රතිශත පදනම් කර ගනිමිනි.

උදාහරණයක් ලෙස වර්ණ සංකේතවලින් පහත දැක්වෙන තත්ත්වය ඇඟවේ:

| **වර්ණය** | **බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ %** | **ගත යුතු පියවර** |
|---|---|---|
| (රතු) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| (කහ) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| (කොළ) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

* *සේවා පාරිභෝජකයන්ගේ තෘප්තිමත් මට්ටම සැලකීමේ දී ඉතා ඉහළ තෘප්ති මට්ටම සහ සාමාන්‍ය තෘප්ති මට්ටම යන දෙකම සැළකිල්ලට ගෙන ඇත.*

**17 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරන්නේ මහජනතාව වෙත සේවා සැපයීම දෙවන සමීක්ෂණ කාල සීමාව තුළ වර්ධනය වී ඇති බවයි. (සේවා පිළිබඳ තෘප්තිය ඉහළ යාම ඉහළට දක්වන ලද ඊ තල සටහන් වෙතින් පෙන්නුම් කරයි.) කෙසේ වෙතත් තව දුරටත් සේවා සැපයීමේ විවිධ අංශ දියුණු වියයුතු බවත්, ප්‍රාදේශීය සභාවන්ගේ අවධානය තව දුරටත් මෙම සේවා අංශ කෙරෙහි යොමු වියයුතු බවත් මෙමඟින් පෙන්නුම් ඉස්මතු ව පෙනේ.

**17 වැනි රූප සටහන : සේවාවන් පිළිබඳ තෘප්තිය ආශ්‍රිත ශ්‍රේණිගත කිරීම්**

| | පානීය ජලය | කුණුකසළ එකතු කිරීම | මාර්ග | වීථි ලාම්පු | කාණු පද්ධතිය | ක්‍රීඩා පිට්ටනි | පුස්තකාල |
|---|---|---|---|---|---|---|---|
| **දෙවන සමීක්ෂණය** | | | | | | | |
| මැරිටයිම්පට්ටු | 54% ↑ | | 49% ↑ | 46% ↓ | | 71% ↑ | 76% ↓ |
| ඔට්ටුසුඩාන් | 80% ↑ | | 48% ↑ | 35% | 54% | 64% ↑ | 69% ↓ |
| වැලිඔය | | | | | | | |
| **පළමු සමීක්ෂණය** | | | | | | | |
| මැරිටයිම්පට්ටු | | | 45% | 47% | | 61% | 98% |
| ඔට්ටුසුඩාන් | 30% | | 45% | | | 57% | 90% |
| වැලිඔය | 45% | | | | | 72% | 64% |

| | |
|---|---|
| (රතු) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%ට වඩා අඩු |
| (කහ) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%-60% අතර |
| (කොළ) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 60%ට වඩා වැඩි |

# 4. නිර්දේශ


## 4.1. වැඩි දියුණු කළ යුතු සේවා අංශ

### 4.1.1. සංවර්ධනය සඳහා ඉක්මනින් අවධානය යොමු කළ යුතු අංශ

දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් මතුවන ප්‍රතිඵල අනුව ඉතා ඉක්මනින් සංවර්ධනය සඳහා අවධානය යොමු කළයුතුයැයි ප්‍රතිචාර දැක්වූවන් ඉස්මතු කර තිබෙන අංශ සැලකියයුතු ප්‍රමාණයක් හඳුනාගත හැකිය. එම අංශයන් පිළිබඳ සාරාංශයක් 18 **වැනි රූප සටහන** ඇසුරෙන් පෙන්නුම් කරයි.

මැරිටයිමපට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රාදේශීය සභා බලප්‍රදේශ වල වීථි ලාම්පු සහ මාර්ග පහසුකම් සංවර්ධනය යන්න මූලිකම සංවර්ධනය අවශ්‍යතා බවට පත් ව තිබේ. වැලිඔය ප්‍රදේශයේ පානීය ජලය යන පහසුකම ප්‍රධාන සංවර්ධන අවශ්‍යතාව බවට පත් වී තිබේ. ඉහත දක්වන ලද අංශයන් ප්‍රාදේශීය සභාවන් ඉක්මනින් සංවර්ධනය කළ යුතු අංශයන් බවටත් ප්‍රාදේශීය සභාවන් විසින් ඊළඟ වසර සඳහා අයවැය සැකසීමේදී මූලිකත්වය දියයුතු අංශ බවටත් පත් ව තිබේ. ඊට අමතරව පුස්තකාල පහසුකම්, ක්‍රීඩා පිට්ටනි, කාණු පද්ධතිය ආදී වන අනෙකුත් පහසුකම් සංවර්ධනයටද මූලිකත්වය ලබා දීම අවශ්‍යය බව ඉස්මතු වේ.


**18 වැනි රූප සටහන : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසින් වහාම අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා සේවා**





එමෙන්ම 19, 20 සහ 21 **වැනි** රූප සටහන් මඟින් පළමු සහ දෙවන සමීක්ෂණ කාල සීමාවන් තුළ එක් එක් ප්‍රාදේශීය සභා බලප්‍රදේශ වල සංවර්ධනය සඳහා මූලිකත්වය දීමට අවශ්‍ය බව ඉස්මතු වූ සේවා අංශ පිළිබඳව ඉස්මතු කෙරෙයි. මෙම සංවර්ධන අවශ්‍යතාවන්ගේ ඉතා කුඩා වෙනස්වීම් ඒ අනුව හඳුනාගත හැකි වේ.

මැරිටයිම්පට්ටු සහ ඔට්ටුසුඩාන් යන ප්‍රදේශයන්හි පළමු සහ දෙවන සමීක්ෂණ කාලයන් වල වාර්තා වූ සංවර්ධන අවශ්‍යතා වන වීථි ලාම්පු, මාර්ග හා පුස්තකාල පහසුකම් යන අංශ බොහෝ දුරට සමාන බවක් පෙන්නුම් කරයි. එමෙන්ම වැලිඔය ප්‍රදේශයේද මූලික සංවර්ධන අවශ්‍යතා ලෙස ඉස්මතු වූ පානීය ජලය, මාර්ග සහ වීථි ලාම්පු යන අංශයන්ද තව දුරටත් සංවර්ධනය කලයුතු බවට ඉස්මතු වී තිබේ.


**19 වැනි රූප සටහන : මැරිටයිම්පට්ටු කොට්ඨාශය තුළ පවත්නා වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා සේවා**




**20 වැනි රූප සටහන : ඔට්ටුසුඩාන් කොට්ඨාශය තුළ පවත්නා වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා සේවා**



**21 වැනි රූප සටහන : වැලිඔය කොට්ඨාශය තුළ පවත්නා වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා සේවා**




ප්‍රතිචාර දැක්වූවන් ප්‍රාදේශීය සභා විසින් කෙරෙන රාජ්‍ය සේවා සම්පාදනය සම්බන්ධයෙන් පොදුවේ අතෘප්තිමත් බව පෙන්නුම් කළ තැන්වල දී ඔවුන් අතෘප්තියට හේතු වශයෙන් හඳුනා ගත්තේ අවශ්‍ය පහසුකම් නොමැතිකම, පහසුකම් නඩත්තු නොකිරීම (පාරවල් හා ජලාපවහන පද්ධති අබලන් වීම, වීදි ලාම්පු නොමැතිකම යනාදිය) නිසා ආරක්ෂාව සම්බන්ධයෙන් මතු වන ගැටලු, පවත්නා පහසුකම් පිළිබඳව මහජනයා දැනුවත් නොකිරීම, පැමිණිලි සම්බන්ධයෙන් රජයේ නිලධාරීන්ගේ දක්වන දුර්වල ප්‍රතිචාරය සහ අදාළ බලධාරීන් නිසි නිරීක්ෂණයක් හෝ අධීක්ෂණයක් නොකිරීම වැනි කරුණු ය. ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිචාර දක්වන්නන් කළ යෝජනාවලින් අවධාරණය වූයේ නිසි සේවා සම්පාදනය සම්බන්ධයෙන් දේශපාලඥයන් හා රජයේ නිලධාරීන් වඩාත් වග වීමේ අවශ්‍යතාව, සේවා සම්පාදනය වඩාත් හොඳින් සැලසුම් කෙරෙන හා නිරීක්ෂණය කෙරෙන බව සහතික කිරීමේ අවශ්‍යතාව, ගම් මට්ටමේ දී සේවාවන් පරිහරණය කරන්නන්ගෙන් උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාව සහ ප්‍රාදේශීය සභා විසින් සේවාවන් සම්පාදනය කෙරෙන බව ගැන මහජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාව යි.

## 4.1.2. වෙනත් සලකා බැලීම්

මෙම ප්‍රාදේශීය සභා සඳහා ඉතා සීමිත කාලයක් (පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් පසු මාස හතරක පමණ කාලයක්) අදාළ සේවා අංශ සංවර්ධනයට හා සොයා බැලීම සඳහා හිමි වූ අතර, එම කාලය තුල අදාළ සේවා සංවර්ධනයටත්, ගැටලු විසඳීමටත් ප්‍රාදේශීය සභා විසින් ගෙන තිබෙන ක්‍රියාමාර්ග සැලකියයුතු ඵලදායිත්වයක් පෙන්නුම් කරයි. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් (විශේෂයන්ම **17 වැනි රූප සටහන** ) මඟින් පෙන්නුම් කරන අංශ) සේවා අංශ සංවර්ධනයේ ප්‍රගතිය සහ අනාගතයේ සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු අංශ මොනවාද යන්න හඳුනාගැනීමටත් උපකාරී වේ.

මෙම අධ්‍යයනය මගින් ඉස්මතු කරන ලද සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින ගැටලු සහ දුර්වලතා ඉතා සමීපව අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කර ගතයුතු වන අතර, ඒ අනුව ඒවාට විසඳුම් සෙවිය යුතුව පවතී. පොදු සේවා සැපයීම සහ මහජනයාට හිතකර සේවාවක් සැපයීම සඳහා සැලසුම් සැකසීමේදී ඉහත ඉස්මතු වූ මූලික සංවර්ධනය කළයුතු සේවා කෙරෙහි තවදුරටත් මූලික අවධානය සැපයීම වැදගත් වනු ඇත.

## 4.2. ඉදිරි මාවත

පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණයේ ඉස්මතු වූ සොයා ගැනීම් පදනම් කරගනිමින් 2018 වසරේ මැයි මාසයේ දී ඒ ඒ සේවා අංශ දියුණුවට අවශ්‍ය ක්‍රියාකාරී සැලසුම් (ඇමුණුම 1 පරිදි) සකසන ලදී. ඒ අනුව 2018 වසරේ ඔක්තෝබර් මාසයේ පැවැත්වෙන විද්‍යුත් පුරවැසි වාර්තා පතේ දෙවන වටයට පෙර සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන හා දීර්ඝ කාලීන අරමුණු හඳුනා ගනිමින් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිණිස සේවා සම්පාදකයන් සහ සේවාලාභීන් අතර සාකච්ඡාවලට පහසුකම් සපයන ලදී. මෙම ක්‍රියාකාරී සැලසුම් සිවිල් සංවිධාන වලට අදාළ සේවාවන්ගේ ප්‍රගතිය සහ සංවර්ධනය සොයා බැලීමටත්, ඒ සඳහා වග වීමටත් ඉමහත් පිටිවහලක් සපයනු ලැබිය.

පළමු පුරවැසි වාර්තපත් සමීක්ෂණයේ ප්‍රගතිය සහ එමගින් ඉස්මතු වූ සේවා සංවර්ධන අවශ්‍යතා වල වර්ධනය සොයා බැලීම සඳහා වන දෙවන විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය 2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිදු කරන ලදී. පහත දැක්වෙන වර්ණ **17 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරන පරිදි එකේ එක සේවාවේ තෘප්ති මට්ටමත්, තව දුරතත් සංවර්ධනය වියයුතු අංශයන් පිළිබඳවත් අවබෝධයක් සපයයි. ඒ අනුව එමගින් පළමු හා දෙවන සමීක්ෂණ තුලදී අදාළ සේවා පිලිබඳ තෘප්ති මට්ටම්හි සංසන්දනාත්මක ප්‍රකාශනයක් පෙන්නුම් කරයි. ඒ අනුව එක් එක් සේවාවට අදාළ වර්ණ වෙනස වීම් මගින් පෙන්නුම් කරන්නේ මාස හතරක කාල සීමාව තුල අදාළ සේවාවේ සිදුවූ ප්‍රගතියයි.

| වර්ණය | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ % | ගත යුතු පියවර |
|---|---|---|
| රතු | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| කහ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| කොළ | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

* සේවා පාරිභෝජකයන්ගේ තෘප්තිමත් මට්ටම සැලකීමේ දී ඉතා ඉහළ තෘප්ති මට්ටම සහ සාමාන්‍ය තෘප්ති මට්ටම යන දෙකම සැළකිල්ලට ගෙන ඇත.

එමෙන්ම අදාළ සේවාවේ වර්ණය වෙනස් වීම පමණක් අනිවාර්ය නොවන අතර අදාළ සේවාවේ ප්‍රගතිය විමසීමට අදාළ සේවාව සඳහා වන තෘප්ති මට්ටමේ ප්‍රතිශතකමය වෙනස් වීමද ප්‍රමාණවත්ය.

අදාළ සේවාවන් සම්බන්ධ තෘප්ති මට්ටම වර්ධනය වීම සම්බන්ධව හඳුනා ගැනීමේදී පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් ඉස්මතු කරන ලද අවශ්‍යතා හා දැනුවත් වීම සේවා සපයන ආයතන වලට ඒ පිලිබඳ සංවාදයක් ඇති කිරීමටත්, අදාළ සේවා සංවර්ධනය කිරීමටත් උපකාරී වී තිබේ. ඒ අනුව ඇතැම් ප්‍රදේශ වල ජනතාවගේ සේවා ලැබීම පිලිබඳ තෘප්තිය සැලකියයුතු මට්ටමක ඉහල යාමක් පෙන්නුම් කරයි. ඒ අනුව මෙම ප්‍රගති සටහන (**17 වැනි රූප සටහන**) ඉතා වැදගත් ප්‍රතිඵල රාශියක් ජනිත කරයි.

එමගින් සේවා භාවිත කරන්නන් වෙත තමා ලබන සේවාව පිලිබඳ තමන්ගේ තෘප්ති මට්ටම සේවා සපයන ආයතන සන්නිවේදනය කිරීමට අවස්ථාවක් සලසා දෙයි. එය සේවා සපයන්නන් වෙත හා සේවාලාභීන් වෙත සමාජමය වශයෙන් වග වීමේ යාන්ත්‍රණයක් සකසයි. එමෙන්ම මෙම ක්‍රමවේදය මහජනයාගේ අභිලාශ හඳුනා ගැනීමට මහජන නියෝජිතයන් වෙත ඉතා වැදගත් ක්‍රමවේදයක් වේ. ඒ අනුව තම තමන්ගේ බලප්‍රදේශයන් වල පළමු සහ දෙවන සමීක්ෂණ වලදී සේවා සංවර්ධනය වී තිබෙන්නේ කෙසේද, තවදුරටත් සංවර්ධනය වියයුත්තේ මොනවාද යන්න පිලිබඳ අවශ්‍ය තොරතුරු සපයයි.

ඉලක්ක පියවරයන්ට මුල පිරීම සඳහා පහත දැක්වෙන පියවරයන් නිර්දේශ කළ හැකි ය:

- විද්‍යුත් පුරවැසි වාර්තා පතේ ශ්‍රේණිගත කිරීම් පදනම් කර ගෙන සේවා කාර්ය සාධනය සම්බන්ධයෙන් විශේෂ දුර්වලතාවක් පෙන්නුම් කරන අංශ හඳුනා ගන්න,

- සේවාවන් වැඩි දියුණු කිරීම පිණිස සැපිරීමට සිදු විය හැකි අඩුපාඩුකම් හඳුනා ගනිමින් ඵලදායක සේවා සම්පාදනයට බාධා කරන පාදක හේතු හා සාධක කවරේ දැයි විමසා බලන්න,
- සේවා සම්පාදනයේ අඩුපාඩුකම් මග හැරවීම සඳහා එක වර මැදිහත් වීම් ගණනාවක් කිරීමට සිදු විය හැකි ය,
- සේවා සම්පාදනය සම්බන්ධයෙන් පවත්නා අඩුපාඩුකම් මග හැරවූ පසු සේවාවන් පරිහරණය කරන්නන්ගේ තෘප්තියේ මට්ටම් පිළිබඳව පසු විපරමක යෙදීම සේවා කාර්ය සාධනය අවම මට්ටම්වලින් ඉහළට වැඩි දියුණු වී ඇත් දැයි තීරණය කිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි ය.

## 1 ඇමුණුම: ක්‍රියාකාරී සැලසුම්:

*මෙම ක්‍රියාකාරී සැලැස්ම මුලතිවු හි මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාවේ දී පවත්වන ලද ප්‍රාරම්භක සොයා ගැනීම් බෙදාහදා ගැනීමේ සැසියේ දී කෙරුණු සාකච්ඡාව පදනම් කර ගත්තකි.

**විද්‍යුත් පුරවැසි වාර්තා පතේ සොයා ගැනීම් පදනම් කර ගෙන ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම - මැරිටයිම්පත්තු ප්‍රාදේශීය සභාව**

| අනුක්‍රමික අංකය | සේවා ප්‍රමුඛතාව (කුමන සේවාවන් ද) | දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන | වගකිව යුත්තේ කවුරුන් ද | වෙනත් පාර්ශ්වකරුවන්/ අවශ්‍ය සම්පත් | ආරම්භ කරන දිනය | අවසන් කරන දිනය | පසු විපරමේ යෙදෙන්නේ කවුරුන් ද |
|---|---|---|---|---|---|---|---|
| 1 | වීදි ලාම්පු | කෙටි කාලීන | ප්‍රාදේශීය සභාව | RDS | ක්‍රියාත්මක වෙමින් පවතී | | RDS/ ප්‍රාදේශීය සභාව |

**සහභාගිකයෝ:**


*මෙම ක්‍රියාකාරී සැලැස්ම පුදුකුඩිරිප්පු ප්‍රාදේශීය සභාවේ දී පවත්වන ලද ප්‍රාරම්භක සොයා ගැනීම් බෙදාහදා ගැනීමේ සැසියේ දී කෙරුණු සාකච්ඡාව පදනම් කර ගත්තකි.

**විද්‍යුත් පුරවැසි වාර්තා පතේ සොයා ගැනීම් පදනම් කර ගෙන ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම - පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාව**

| අනුක්‍රමික අංකය | සේවා ප්‍රමුඛතාව (කුමන සේවාවන් ද) | දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන | වගකිව යුත්තේ කවුරුන් ද | වෙනත් පාර්ශ්වකරුවන්/ අවශ්‍ය සම්පත් | ආරම්භ කරන දිනය | අවසන් කරන දිනය | පසු විපරමේ යෙදෙන්නේ කවුරුන් ද |
|---|---|---|---|---|---|---|---|
| 1 | වීදි ලාම්පු | කෙටි කාලීන | ප්‍රාදේශීය සභාව | RDS | ක්‍රියාත්මක වෙමින් පවතී | | RDS/ ප්‍රාදේශීය සභාව |

**සහභාගිකයෝ:**

CEPA ආයතනය, යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත "සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම" ව්‍යාපෘතිය යටතේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් ගණනාවක විද්‍යුත් පුරවැසි වාර්තා පත් (eCRC) සමීක්ෂණ පැවැත්වීමේ කාර්යයට මුල පිරුවේ ය. විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණවල අභිමතාර්ථය වූයේ අධ්‍යයන ප්‍රදේශය තුළ



(i) ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය
(ii) ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය

යන ක්ෂේත්‍ර දෙකට අදාළව සේවාවන්හි ගුණාත්මක බව, සේවා සම්පාදකයන්ගේ වග වීම හා වැඩි දියුණු කළ යුතු අංශ තීරණය කිරීම යි. මෙම වාර්තාව සමාජීය වග වීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස විද්‍යුත් පුරවැසි වාර්තා පත යොදා ගැනීමේ අරමුණ ඇතිව පවත්වන ලද ප්‍රථම විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ සොයා ගැනීම් ඉදිරිපත් කරයි. දිස්ත්‍රික්ක තුන තුළ සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා වහා ම අවධානය යොමු කළ යුතු හා පියවර ගත යුතු යැයි ප්‍රතිචාර දැක්වූවන් විසින් හඳුනා ගන්නා ලද අංශ ගණනාවක් විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් අනාවරණය විය. විද්‍යුත් පුරවැසි වාර්තා සමීක්ෂණයේ ප්‍රාරම්භක සොයා ගැනීම් පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කෙරුණු අතර සේවා සම්පාදකයන් හා සේවාලාභීන් අතර සාකච්ඡා සඳහා පහසුකම් සපයනු ලැබිණ. මෙම වාර්තාව සම්පාදනය කර ඇත්තේ මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ප්‍රචලිත කිරීම පිණිස සහ අවශ්‍ය තැන්වල දී මෙහෙයුම් ප්‍රතිපත්ති වෙනුවෙන් අභිදේශනයේ යෙදීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ගැනීම පිණිස මෙම තොරතුරු යොදා ගැනීම සඳහා ය.

29, ආර්. ජී. සේනානායක මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 11 46902200, 2676955
ෆැක්ස් :+94 11 2676959
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

centre for poverty analysis

European Union
යුරෝපා සංගමය ஐரோப்பிய ஒன்றியம்

ACTED

ISBN: 978-955-3628-37-4